# නර්තනය

## 10 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය
(2015 සිට ක්‍රියාත්මක වේ)



සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# නර්තනය

## ගුරු මාර්ගෝපදේශය

## 10 ශ්‍රේණිය

**(2015 සිට ක්‍රියාත්මක කෙරේ.)**


**සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**
**ශ්‍රී ලංකාව**

**වෙබ් අඩවිය : www.nie.lk**
**විද්‍යුත් තැපැල : info@nie.lk**

10 ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය
ප්‍රථම මුද්‍රණය 2015
C ජාතික අධ්‍යාපන ආයතනය

ISBN : .....................................

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය :

මුද්‍රණාලය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | - | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය සම්බන්ධීකරණය** | - | බුද්ධි කල්‍යාණි මුතුකුමාරණ - කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **ලේඛක මණ්ඩලය** | | |
| **අභ්‍යන්තර** | - | එස්. වර්ණසිංහ මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, |
| | - | බුද්ධි කල්‍යාණි මුතුකුමාරණ මහත්මිය - කථිකාචාර්ය, |
| | - | බී. එම්. එස්. ද සොයිසා මහත්මිය - කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **බාහිර** | - | ගුණසේන රාජපක්ෂ මහතා - ජ්‍යෙ. කථිකාචාර්ය (විශ්‍රාමික), |
| | - | කේ. සිරිල් මීගම මහතා-ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික),<br>ගුරු අභ්‍යාස විද්‍යාලය, ගිරාගම. |
| | - | ජයන්තා හෙට්ටියවත්ත<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම. |
| | - | කේ. සුසන්ත ගුණවර්ධන මහතා,<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>කලාප අධ්‍යාපන කාර්යාලය, පිළිමතලාව. |
| | - | ඩී. පී. වයි නිමල් කුමාර මහතා - කථිකාචාර්ය,<br>ගුරු විද්‍යාලය, මහරගම. |
| | - | බී. සුජිත් මහතා - ගුරු උපදේශක,<br>කලාප අධ්‍යාපන කාර්යාලය, හම්බන්තොට. |
| | - | එම්. හේවාවිතාරණ මහත්මිය - ගුරු සේවය,<br>බප/ජය/විද්‍යාකර බාලිකා විද්‍යාලය, මහරගම. |
| | - | එම්. එම්. එස්. පී. කේ. මාරසිංහ මහත්මිය - ගුරු සේවය,<br>බප/හෝ/ රාජසිංහ මහ විද්‍යාලය, හංවැල්ල. |
| | - | ආර්. පී. ඒ. එස්. ජයලත් මහත්මිය - ගුරු සේවය,<br>මහ/පුෂ්පදාන මහ විද්‍යාලය, මහනුවර |
| | - | ජේ. වී. එස්. පුස්සවෙල මහතා - ගුරුසේවය,<br>දප/ගා/ ඕල්කට් මහ විද්‍යාලය, ගාල්ල. |
| | - | ඒ. ඩබ්. බියංකා එම්. අබේසිංහ මහත්මිය - ගුරු සේවය,<br>බප/ජය/ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය. |
| | - | එම්.එම්. සමන්ත විජේසිරි මහතා - ගුරු සේවය,<br>දප/මාර/දික්වැල්ල උතුර මහ විද්‍යාලය, මාතර. |
| | - | එච්. එල්. සමන්කුමාර මහතා - ගුරුසේවය,<br>දප/ගා/ශ්‍රී දේවානන්ද මහ විද්‍යාලය,<br>පනියන, අම්බලන්ගොඩ. |
| | - | නොයෙල් වසන්ත විතානගේ මහතා - ගුරු සේවය,<br>බප/ජය/ ධර්මපාල විද්‍යාලය, පන්නිපිටිය |

| | | |
|---|---|---|
| **විෂය සංස්කාරක මණ්ඩලය** | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා<br>මහාචාර්ය ලයනල් බෙන්තරගේ මහතා<br>මහාචාර්ය ආරියරත්න කලුආරච්චි මහතා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වික්‍රමසිංහ බණ්ඩාර මහතා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අසෝකා දිසානායක මහත්මිය<br>ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය<br>සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, කොළඹ 07. |
| **භාෂා සංස්කරණය** | - | ආචාර්ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය,<br>කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.<br>එස්.ඕ. ප්‍රනාන්දු මහතා - අධ්‍යක්ෂ (විශ්‍රාමික)<br>ඊ.ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා<br>සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

දෛනික ජීවිතය සාර්ථක ව පවත්වා ගැනීම හා යහපත් සමාජයක් ගොඩනැංවීමට අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොටගෙන, පාසල් නර්තන අධ්‍යාපනය මගින් එකී නිපුණතා සංවර්ධනයට මාර්ගෝපදේශකත්වය සැපයීමට මෙම මාර්ගෝපදේශය සකස් කර ඇත. නර්තන විෂය භාර ව කටයුතු කරන ගුරු භවතුන් මෙම අත්පොත පරිශීලනයේ දීත් පංති කාමර ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමේ දීත් ලබන ස්වකීය අත්දැකීම් ද සැලකිල්ලට ගත යුතු වේ.

10 ශ්‍රේණිය නර්තන විෂය නිර්දේශය නිපුණතා 08 කින් සමන්විත ය. ඊට අදාළ නිපුණතා මට්ටම් 24 ක් යටතේ ක්‍රියාකාරකම් 29 ක් පෙළ ගස්වා ඇත. නිපුණතා, නිපුණතා මට්ටම් හා සබැඳි ක්‍රියාකාරකම්වල අන්තර්ගත විෂය සන්ධාරයෙන් ලබන දැනුමින් පමණක් පෝෂිත ව විභාගවලින් ඉහළ සාමර්ථ්‍ය ලබාගත්ත ද යහපත් ජීවිතයක් ගත කිරීමට එය ප්‍රමාණවත් නොවේ. දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනයෙන් හිස, හදවත හා දෑත් ද පෝෂණය කළ යුතු වේ. එකී පෝෂණයෙන් තමා ද සමාජය ද යහපත් මාවතක් කරා යොමු කරවීමට ගැළපෙන ජීවිතය නංවාලීම අද්‍යතන යුගයේ ප්‍රබල සමාජ අවශ්‍යතාවකි.

උක්ත කරුණු සැලකිල්ලට ගනිමින් මෙම මාර්ගෝපදේශයෙහි ක්‍රියාකාරකම් සරල ව පෙළගස්වා ඇති අතර විෂය අන්තර්ගතය දක්වා ඇත්තේ සංක්ෂිප්ත වශයෙනි. ක්‍රියාකාරකම් සැලසුම සඳහා දී ඇති උපදෙස්වල පියවර 01 සඳහා ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබාදීමට වඩාත් සුදුසු කාර්යක්ෂම හා නිර්මාණශීලී ඉගෙනුම් ප්‍රවේශ භාවිත කළ හැකි ය. නර්තන විෂය ඉගෙනුම් ක්‍රමශිල්ප විවිධ ය. එමෙන් ම සුවිශේෂ ය. ක්‍රියාකාරකම හා ශිෂ්‍ය ශක්‍යතා හඳුනාගනිමින් අපේක්ෂිත ඉගෙනුම් එල කරා ළඟා වීමට හැකි වඩාත් ඵලදායී ඉගෙනුම් ක්‍රම තෝරා ගැනීමට අවකාශ ඇත.

ප්‍රායෝගික කුසලතා සංවර්ධනයේ දී වඩාත් සුදුසු ස්ථානයක් තෝරා ගැනීමට ගුරුවරයා මැදිහත්කරුවකු විය යුතු ය. කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී මනා ආකල්ප මෙන් ම සමූහයක් වශයෙන් ජීවත් වීමේ දී අනුගමනය කළ යුතු ජීවන පුරුදු පිළිබඳ අත්දැකීම් ලබා ගත හැකි ආකාරයට ක්‍රියාකාරකම් සැලසුම් කළ යුතු වේ. පංතියේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව අනුව කණ්ඩායම් කළ යුතු ය. ක්‍රියාකාරකම් සඳහා ශිෂ්‍යයන් සපයා ගෙන ආ යුතු රංග උපකරණ හා ද්‍රව්‍ය ඇත්නම් ඒ බව කලින් දැනුම් දීම අත්‍යවශ්‍ය වේ. ගුරු මාර්ගෝපදේශයෙහි එක් එක් නිපුණතා මට්ටම්වල ක්‍රියාකාරකම් සඳහා වෙන් කර ඇති කාලය වඩාත් ඵලදායී ලෙස භාවිත කළ හැකි අතර, අධ්‍යාපන විද්‍යාත්මක පදනමින් දක්වා ඇති වාර සටහන් ක්‍රියාත්මක කිරීමෙන් සමස්ත ඇගැයීම් ක්‍රියාවලිය තුළ සංගත බව ආරක්ෂා වේ.

පාඩම සංවර්ධනයට අදාළ කර ගත හැකි ඉගෙනුම්/ඉගැන්වීම් උපකරණ ගුණාත්මක යෙදවුම් ලෙස ඉදිරිපත් කර ඇති අතර වෙනත් සුදුසු භෞතික හා මානව සම්පත් සැලසුම් සහගත ව භාවිත කිරීම අපේක්ෂා කෙරේ. සෑම ක්‍රියාකාරකමක් ම විනෝදය, කුතුහලය, අළුත් අත්දැකීම් හා ප්‍රායෝගික වීම වැදගත් වේ. ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය පින්තූර, වගු, දෘශ්‍ය හා ශ්‍රව්‍යපට, ප්‍රශ්නාවලි හා පැවරුම් සූදානම් කර ගත යුතු වේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පංතියේ සෑම ළමයකු ම ඒ ඒ නිපුණතාව සම්බන්ධ ව ආසන්න ප්‍රවීණතාවට ගෙන ඒමට ගුරුවරයා සම්පත් දායකයකු වේ. අපේක්ෂිත ඉගෙනුම් පල සාක්ෂාත්කරණය හා සිසුන්ගේ ප්‍රවීණතා මට්ටම් පිළිබඳ ව ගුරු සිසු දෙපක්ෂය ම දැනුවත් විය යුතු ය. ඇගයීම හා තක්සේරුකරණ උපදෙස් යටතේ ඉගෙනුම් පල ඉලක්ක කොට ගනිමින් සෑම ක්‍රියාකාරකමක් අවසානයේ දී හෝ සුදුසු අවස්ථාවල දී ඇගයීමට ලක් කිරීමට අවශ්‍ය ප්‍රශ්න සඳහන් කර ඇත. ඒ සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක සකස් කරගැනීම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සුවිශේෂ අංගයකි. ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලිය නිම කර සිසුන්ගේ දැනුම තහවුරු කිරීම සඳහා ප්‍රතිපෝෂණ හා ඉදිරි පෝෂණ කටයුතු සැලසුම් කිරීමේ උක්ත ගුරු කාර්යභාරය ඇසුරු කොටගත් නූතන ගුරු භූමිකාව, පරිණාමන ගුරු භූමිකාව (Transformation Role) ලෙස නම් කර තිබේ.

නිර්මාණශීලී ගුරුවරයකු ලෙස ක්‍රියාකාරකම් සැලසුම් කරගැනීම සඳහා සරල මග පෙන්වීමක් ලෙස ඉදිරිපත් කර ඇති මෙම ගුරු මාර්ගෝපදේශය ඉගෙනුම් ඉගැන්වීම් හා ඇගයීමේ කාර්යය සාර්ථක කර ගැනීමට මනා පිටිවහලක් වේවා යි පතමු.

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | ix |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 – 50 |
| විවිධ සහාය | 51 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

# විෂය හැඳින්වීම

අපේ මාතෘභූමියටත්, සංස්කෘතියටත්, සොබාදහම හා සමස්ත ජීව, අජීව විශ්ව ධාතුවටත් හිතකාමී පුරවැසියකු නිර්මාණය කිරීමේ පුළුල් ජාතික පරමාර්ථයෙන් පාසල් පද්ධතිය තුළ දරුවන්ට ඉගෙනීමට ලැබෙන සුවිශේෂතම විෂයය සෞන්දර්ය විෂයයි. එය ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව ලෙස අප විසින් හඳුනාගන්නා ලද පහත දැක්වෙන සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම කියැවීමෙන් ඔබට මැනවින් අවබෝධ වනු ඇත.

සෞන්දර්යයෙන් සංස්කෘතිකමය ලැදියා පුබුදුවා, එමගින් නිර්මාණශීලී බව, සංවේදීතාව, දරා ගැනීම, ශ්‍රී ලාංකේය අනන්‍යතාව හා දේශානුරාගය වඩවා මාතෘ භූමිය කෙරෙහි සංවේදී වූ දරු කැලක් හා සමාජයක් බිහි කිරීම.

("To sensitize students and the community through aesthetics to the Mother Land, endowed with cultural pride, creativity, sensitivity, tolerance, partriotism and a sense of national identity")

දේශය ගොඩනැංවීමේ දී විශ්වය සමග යහ සබඳතා පවත්වා ගනිමින් පෙරට යන අනාගත පුරවැසියා කෙසේ විය යුතු ද යන්න ගැඹුරින් විමසා බැලීමත් සමග මෙතෙක් පැවති සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම අතික්‍රමණය කොට මෙම 2015 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය දෙස නවමු දෘෂ්ටියක් හෙළා ඇති බව එනයින් ම ඔබට පැහැදිලි වනු ඇත.

උසස් රසඥතා ඥානයකින් යුතු මානව හිතවාදී චින්තනයෙහි හෙබි ක්‍රියාශීලී සමාජානුයෝගී පුරවැසියකු ලෙස වැඩ ලෝකයට පිවිසීමට සෞන්දර්ය අධ්‍යාපනයෙන් ලබන ආධ්‍යාත්මික හා ශාරීරික ප්‍රබෝධය ඉවහල් කරගැනීම අද්‍යතන සමාජ අවශ්‍යතාවකි.

සෞන්දර්ය අධ්‍යාපනයෙන් දරුවකු තුළ සොඳුරු මෙන් ම නිර්මාණශීලී හැකියාවන් හා චින්තනය ප්‍රවර්ධනය කිරීම ද විනය ගරුක, සදාචාරවත් අභිමානවත් පුරවැසියකු තැනීමේ වගකීම ඉටු කිරීම ද දෙවැනි වන්නේ ආගමෙන් මිනිසාට සැලසෙන සේවාවට පමණි.

එබැවින් විද්‍යා, ගණිත, වාණිජ, තාක්ෂණ හා භාෂා විෂයයන්ගෙන් ඥානනය වන මිනිස් සත්ත්වයාට මිනිස් ගුණ උරුම කරදෙන සෞන්දර්ය අධ්‍යාපනික විෂයයන් ඉගෙනීම එදාටත් වඩා අදට සහ හෙටට අත්‍යවශ්‍ය ම බැව් තරයේ ම කිව යුතු ව ඇත.

මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණයත් සමග අභිනවයෙන් 6 ශ්‍රේණියට පැමිණෙන දරුවන් නවමු චින්තනයක් ඇති අළුත් පරපුරක් ලෙස තැනුම උදෙසා පළමු ක්‍රියාකාරකමින් ම ස්වයං පෙලඹවීමක් ඇති වන පරිදි කැමැත්ත හා විශ්වාසය ගුරුවරයා විසින් දිනා ගත යුතු ය. ඒ සඳහා ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන් අතින් විරචිත "ප්‍රාර්ථනාව" නම් වූ කුඩා ළමා ගීයක් දරුවාගේ ජීවන ප්‍රතිඥාවක් ලෙස දිනපතා පාඩම ඇරඹුමට පෙර ගැයුමට අපි යෝජනා කරමු.

| | | | |
|---|---|---|---|
| ස ස ස - | ස ස ස - | රි රි රි - | රි රි රි - |
| හො ඳ දේ ऽ | හි ත මී ऽ | හි තු දේ ऽ | කි ය මී ऽ |
| ස රි ස රි | ස ස රි - | රි ස රි ස | ස ස ස - |
| කි යු දේ ऽ | ක ර මී ऽ | ක ර මි න් | හැ දෙ මී ऽ |

මෙම ප්‍රවේශයත් සමග ඇරඹෙන සෞන්දර්යයේ වින්දනාත්මක ඉගෙනුම ජාතික, සංස්කෘතික අනන්‍යතා හා විවිධ සම්ප්‍රදායයන් ස්පර්ශ කරමින් විශ්ව චින්තනයක් කරා දරුවාගේ දැනුම, හැකියා හා ආකල්ප පුළුල් කරගැනීමට හැකි වන පරිදි විෂය කරුණු මෙහි දී අධ්‍යාපනික හා මනෝ විද්‍යාත්මක පදනමින් යුතු ව ක්‍රමික ව පෙළ ගස්වා ඇත.

එහි දී නායකත්වය, සහභාගිත්වය, ඉදිරිපත් වීම, සුහදත්වය, සාමූහිකත්වය, ඇගැයීම, සවන්දීම, පිළිගැනීම, බෙදාහදා ගැනීම, අන්‍යයන්ට ගරු කිරීම ආදී ආකල්ප සෑම සිසුවකු තුළ ම වර්ධනයට අවස්ථාව සැලසෙන පරිදි අප විසින් යෝජිත ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කරමින් ඉගෙනුම් ඉගැන්වීම් පරිසරය සකසා ගැනීමට ගුරුවරයා වශයෙන් ඔබට ද ඉඩකඩ ඇත.

තවද දෛනික ජීවිතයේ දී මුහුණ දෙන විවිධ ගැටලුවලට සාර්ථක ව මුහුණ දී තර්කානුකූල ව හා නිර්මාණාත්මක ව චින්තනය මෙහෙයවා ඒවා විසඳාගැනීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා වර්ධනය කිරීමට ද අප විසින් වත්මන් පරපුරට දායකත්වය සැපයිය යුතු ව ඇත.

එබැවින් ගුරු භවතුන් ලෙස ඔබ මෙම ගුරු මාර්ගෝපදේශය පෙරට වඩා හොඳින් පරිශීලනය කරන්නේ නම් ඔබගේ ද චින්තනයට අලුත් ආලෝකයක් හා ප්‍රබෝධයක් ලැබෙනු ඇත. ඒ ආලෝක කිරණ ජාතියේ දරු කැල මත පතිත ව ඔවුන් ද ඉමහත් ප්‍රබෝධයෙන් මෙම විෂයය ඉගෙනීමට යොමු වනු නො අනුමාන ය.

එසේ ම කායික හා මානසික සමබරතාවෙන් හෙබි සෞඛ්‍ය සම්පන්න මෙන් ම නීරෝගී දිවිපෙවතක් ගත කිරීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා සංවර්ධනය කිරීම හා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනංවා ගනිමින් ජාතික හා ජාත්‍යන්තර තලයේ නොසැලී කටයුතු කිරීමට විචාරශීලී මනසකින් හෙබි පුද්ගලයකු බිහි කිරීමට වගවීම සෞන්දර්ය අධ්‍යාපන විෂය භාර ව කටයුතු කරන ඔබ අප සැමගේ වගකීම වේ.

ඒ සඳහා 2015 වසරේ සිට 6 ශ්‍රේණියෙන් ඇරඹී ක්‍රියාත්මක වන මෙම නව ප්‍රතිසංස්කරණය දරුවන් හරහා අපි සැම නවමු ලොවකට පිවිසීමේ වැදගත් අවස්ථාවක් ලෙස දකිමින් අධිෂ්ඨානයෙන් වඩාත් ඵලදායි සේවාවක් සැලසීමට කැප වෙමු.

**අධ්‍යක්ෂ (සෞන්දර්ය)**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

### ජාතික අරමුණු

දෛනික ජීවිතය සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත් අධ්‍යාපනය තුළින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින්, ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම හ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

2. වෙනස් වන ලෝකයක අභියෝගයනට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම.

3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාමට සහාය වීම.

4. පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

7. සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කරගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවණීය ස්ථානයක් හිමි කරගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා, පෝෂණය කිරීම.

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කරගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා :**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව :** සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලාදයී අයුරින් අදහස් හුවමාරු කරගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම :** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය :** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය :** පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා :**
   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා :**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය :** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

   **ජෛව පරිසරය :** සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීව - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

   **භෞතික පරිසරය :** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතා, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සැප පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළ බැහැර කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගැනීම, වැඩ කිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**4. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා :**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනාගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරි ම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

**5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා :**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල ව හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

**6. ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා :**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

**7. ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා :**

සීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගැන්වීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

(ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.)

# නර්තන විෂයයේ අරමුණු

- පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් උසස් නිමාවකින් යුත් කලා කෘති බිහි කිරීම මෙන් ම ජීවිතයේ දී මුහුණපාන විවිධ ගැටලු නිර්මාණශීලී ව විසඳා ගැනීම සඳහා අවශ්‍ය චින්තනය හා නිර්මාණ කුසලතා ප්‍රවර්ධනය කිරීම.

- නර්තන විෂය හා බැඳි ක්‍රියාකාරකම් මගින් අනාගත වැඩ ලෝකයට මුහුණ දිය හැකි ක්‍රියාකාරිත්වය මෙන් ම සමාජයෙහි උසස් ජීවන තත්ත්වයක් ගොඩ නගාගැනීම සඳහා අවශ්‍ය සාමාජීය හා පෞද්ගලික ශක්‍යතා වර්ධනය කිරීම.

- සන්නිවේදන මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කරන වැඩසටහන් අතරින් හරවත් හා යෝග්‍ය වැඩසටහන් තෝරා ගැනීම සඳහා අවශ්‍ය විචාර ශක්ති වර්ධනය, රසඥතා වර්ධනය හා නිවැරදි තීරණ ගැනීමේ හැකියාව ලබා දීම.

- දේශීය, විදේශීය නර්තන හා සබැඳි සංස්කෘතික ලක්ෂණ අධ්‍යයනය මගින් විවිධ සංස්කෘති අගය කිරීම මෙන් ම ජාත්‍යන්තර සමාජයේ දී දේශීය අනන්‍යතාව ආරක්ෂා වන පරිදි කටයුතු කිරීම සඳහා අවශ්‍ය උදාර හැඟීම්, ආකල්ප සංවර්ධනය කිරීම.

- නර්තන විෂය හා බැඳි සංස්කෘතික පසුබිම හා සෙසු සංස්කෘති සතු හරයන් හඳුනාගනිමින් පුද්ගල අභිමානයට ගරු කරන මානව සම්පත් ප්‍රවර්ධනය කිරීම.

- සාර්ථක දිවි පෙවෙතක් ගත කිරීමට අවශ්‍ය කායික හා මානසික සුව සම්පත් වර්ධනය සඳහා නර්තන විෂය හා සබැඳි ක්‍රියාකාරකම් භාවිතයට ගැනීමේ හැකියාව සංවර්ධනය කිරීම.

# 10 ශ්‍රේණිය - නර්තන විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි. | 1.1 ප්‍රදේශයේ පවත්නා වෘත්තීන් තේමා කරගනිමින් නර්තන නිර්මාණ කරයි. | • ධීවර/මැටි/පතල්/තේ/ කොහු/කෘෂි වැනි වෘත්තිවල දක්නට ලැබෙන චලන ඇසුරෙන් නර්තන නිර්මාණය (එක් වෘත්තියක් ඇසුරෙන්) | ප්‍රදේශයේ පවත්නා වෘත්තීන් හඳුනාගෙන නර්තන නිර්මාණ ඉදිරිපත් කරයි. | 05 |
| | 1.2 ගැමි නැටුම් හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනාගනිමින් නර්තන නිර්මාණ කරයි. | • රබන් /චාමර නැටුම හා සබැඳි සුවිශේෂ ලක්ෂණ හඳුනාගනිමින් නර්තන නිර්මාණය | රබන්/චාමර නර්තන අංගයන්හි සුවිශේෂ ලක්ෂණ හඳුනාගනිමින් සමූහයක් ලෙස නර්තන අංගයක් නිර්මාණය කරයි. | 05 |
| | 1.3 භාව ප්‍රකාශ වන පරිදි චරිත නිරූපණය කරයි | • භාව ප්‍රකාශනය- විස්මය සිද්ධියක් ඇසුරෙන් | විස්මය නමැති ස්ථායි භාව යේ සුවිශේෂතා අධ්‍යයනය කර ඒ සඳහා සිද්ධියක් ගොඩනගමින් නර්තන අංගයක් ප්‍රදර්ශනය කරයි. | 03 |

## 10 ශ්‍රේණිය - නර්තන විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි. | 2.1 සාම්ප්‍රදායික නර්තනය හා සබැඳි හස්ත පාද හැසිරවීමේ විධික්‍රම අනුගමනය කරමින් මූලික සරඹ ඉදිරිපත් කරයි. | • ගොඩ සරඹ/ ඉලංගම් සරඹ/ දොඹින පද 1-12 දක්වා කස්තිරම්/ ඉරට්ටි/හමාර පද සමගින්<br>• විලම්භ, මධ්‍ය හා ද්‍රැත ලයට අනුව | සාම්ප්‍රදායික නර්තනයන්වල සරඹ ලය තුනට නර්තනය කර, එහි අවසන් කිරීමේ පද ඉදිරිපත් කරයි. | 04 |
| | 2.2 සාම්ප්‍රදායික චලන භාවිත කරමින් අලංකාර පද නිර්මාණය කරයි. | • සුළු මහ (මාත්‍රා 2 + 4) දෙතිතට අදාළ (බෙර පද ඇසුරින්) අලංකාර පද (මාත්‍රා )02 ක් | අදාළ බෙර පදවලට අනුව අලංකාර පද දෙකක් නිර්මාණය කරයි. | 03 |
| | 2.3 නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි. | • උඩරට -සිංහරාජ වන්නම, සැවුලා වන්නම සම්පූර්ණයෙන්<br>- පහතරට අනුරාගදණ්ඩ තාලය, නාතිලිංචි තාලය ඉරට්ටිය සමග<br>- සබරගමු විරාඩි, මණ්ඩුක වන්නම සම්පූර්ණයෙන් | නිවැරදි අංගහාර සහ ගායන සහිත හා රහිත සාම්ප්‍රදායික නර්තන අංග ඉදිරිපත් කරයි. | 04 |

10 ශ්‍රේණිය - නර්තන විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • දොංජිංත ගතදොංත වට්ටම ආරම්භක පදය සමග මාත්‍රා දෙකක්/<br>• ගුඳ ගති ගත වට්ටමට අයත් මාත්‍රා දෙකක්<br>• ගමන් මාත්‍රය (කස්තිරම, අඩව්ව/ අන්තාඩිය, ඉරට්ටිය/ කලාසම, අඩව්ව සමගින්) | | 03 |
| | 2.4 ප්‍රස්තාරකරණයේ විධි ක්‍රම අනුගමනය කරයි. | • තුන්තිතේ ප්‍රභේද හඳුනාගැනීම<br>• වන්නම්, වට්ටම්, රබන් ,චාමර කවි ප්‍රස්තාර | තුන් තිතේ ප්‍රභේද හඳුනාගනිමින් විධික්‍රම අනුව ගායනය සහිත හා රහිත නර්තන අංගයන්හි කවි පද හා බෙර පද ප්‍රස්ථාර කරයි. | 03 |
| | 2.5 නර්තන කලාව හා සබැඳි ප්‍රකාශන විධි ක්‍රම අධ්‍යයනය කරමින් අදහස් දක්වයි. | • ආංගික, වාචික, සාත්වික හා ආහාර්ය අභිනය | නර්තනය හා සබැඳි සතර අභිනයට අයත් අංගයන්හි සුවිශේෂතා අධ්‍යයනය කර අදහස් දක්වයි. | 02 |

## 10 ශ්‍රේණිය - නර්තන විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 3.1 නිවැරදි ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් බෙර වාදනය කරයි. | • 1 -2 අදාළ බෙර සරඹ සුළු, මැදුම් (මාත්‍රා 2 + 3) දෙතිතට අයත් බෙර පද | බෙර වාදනය හා බැඳි ශිල්පීය ක්‍රම හඳුනා ගෙන ඇත. දෙතිතේ තාලයට බෙර /දවුල් පද වාදනය කරයි. | 03 |
| | 3.2 සන්නිවේදන කාර්ය සඳහා වාද්‍ය භාණ්ඩ භාවිත කළ අවස්ථා විස්තර කරයි. | • අණබෙර , රණබෙර , මළ බෙර, වද බෙර හා හේවිසි වාදනය | සන්නිවේදන කාර්යය සඳහා වාද්‍ය භාණ්ඩ භාවිත කළ අයුරු විමසමින් ඒවායේ සුවිශේෂතා අධ්‍යයනය කර තොරතුරු ඉදිරිපත් කරයි. | 02 |
| 4.0 ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි. | 4.1 නිර්දේශිත ගායන හා සබැඳි සංස්කෘතික පසුබිම විස්තර කරයි. | • චාමර, රබන් , ඔංචිලි වාරම්, ටීකා සී පද, වන්නම් , නමස්කාර ගාථා හා බැඳි සංස්කෘතික පසුබිම | දේශීය ජන ගායනයන්හි සුවිශේෂතා අධ්‍යයනය කර එහි සංස්කෘතික හා සමාජයීය වටිනාකම් විස්තර කරයි. | 06 |
| | 4.2 නියමිත නාදමාලා අනුගමනය කරමින් ජන ගායන ඉදිරිපත් කරයි. | • චාමර, රබන් , ඔංචිලි වාරම් නමස්කාර ගාථා, ටීකා සී පද හා වන්නම් | ආසාතාත්මක හා අනාසාතාත්මක ගායනයන් හි නියමිත නාද මාලා අනුගමනය කරමින් ගායනය කරයි. | 06 |

## 10 ශ්‍රේණිය - නර්තන විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැකගැනීම සඳහා ක්‍රියා කරයි. | 5.1 ශ්‍රී ලාංකේය නර්තන කලාව හා සබැඳි ඓතිහාසික පසුබිම විග්‍රහ කරයි. | • විදේශිකයින්ගේ ඓතිහාසික වාර්තා<br>• මහා වංසයේ සාධක | ශ්‍රී ලාංකේය නර්තන කලාව හා සබැඳි ඓතිහාසික පසුබිම විග්‍රහ කරයි. | 02 |
| | 5.2 ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූවන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි. | • නර්තනයේ ප්‍රවර්ධනයට කාන්තා දායකත්වය<br>- ආචාර්ය වජිරා චිත්‍රසේන මිය<br>- නර්තන ශිල්පිනී මිරැන්ඩා හේමලතා මිය | ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ප්‍රවර්ධනයට කාන්තා දායකත්වය අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි. | 02 |
| | 5.3 ශ්‍රී ලාංකේය ගැමි නාටක හා සබැඳි පසුබිම අධ්‍යයනය කර සුවිශේෂ ලක්ෂණ ඉදිරිපත් කරයි. | • සොකරි නාටකය කථා පුවත, චාරිත්‍ර ගායන, වාදන, නර්තනය හා රංගවස්ත්‍රාභරණ | සොකරි ගැමි නාටකයේ කථා පුවත, චාරිත්‍ර, ගායන, වාදන, නර්තන හා රංග වස්ත්‍රාභරණවල සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි. | 02 |
| | 5.4 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ශාන්තිකර්මවල සුවිශේෂ ලක්ෂණ තුලනාත්මක ව දක්වයි. | කොහොඹා යක් කංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව ශාන්තිකර්මවල කතාපුවත, නර්තන, ගායන, වාදන, රංග වස්ත්‍රාභරණ සැරසිලි හා රංග භාණ්ඩවල සුවිශේෂ ලක්ෂණ | ශ්‍රී ලාංකේය ශාන්තිකර්මවල සුවිශේෂ ලක්ෂණ තුලනාත්මක ව විග්‍රහ කරයි. | 04 |

## 10 ශ්‍රේණිය - නර්තන විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක්-කරයි. | 6.1 ශ්‍රී ලාංකේය මුද්‍රානාට්‍ය කලාවේ පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | • ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය කලාව පිළිබඳ තොරතුරු - හැඳින්වීම - ආරම්භය හා විකාශනය (1930 - 1960 දශකය | ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය කලාව හා බැඳි තොරතුරු ඉදිරිපත් කරයි. | 04 |
| | 6.2 ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍යය නරඹා විචාරයට ලක් කරයි. | • කරදිය /කුඹි කතාව මුද්‍රා නාට්‍ය තේමාව , චරිත , රංගවස්ත්‍රාභරණ , නර්තනය , සංගීතය හා පසුතල නිර්මාණ | ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍යයක සුවිශේෂ ලක්ෂණ අධ්‍යයනය කර එහි වටිනාකම් අගය කරයි. | 04 |
| | 6.3 වෙනත් සංස්කෘතියකට අයත් නර්තන සම්ප්‍රදාය අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි. | • කථකලි නර්තන සම්ප්‍රදාය වචනාර්ථය, ප්‍රචලිත ප්‍රදේශ, නර්තනය, සංගීතය, වාද්‍ය භාණ්ඩ , රංගවස්ත්‍රාභරණ හා අංග රචනය | කථකලි නර්තන සම්ප්‍රදාය හා බැඳි තොරතුරු අධ්‍යයනය කර එහි සුවිශේෂතා විස්තර කරයි. | 02 |

## 10 ශ්‍රේණිය - නර්තන විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 අත්දැකීම් ඇසුරු කරගනිමින් විවිධ කලාංග නිර්මාණය කරයි. | 7.1 නාට්‍ය ගීතයකට නර්තන නිර්මාණය කරයි. | • මෙම ගිම්හාන ..... / හනික වරෙව් කොල්ලනේ..... ගීතයට නර්තන නිර්මාණයක් | ගීතයක පසුබිම අධ්‍යයනය කර ගීත අනුව නර්තන නිර්මාණ ඉදිරිපත් කරයි. | 04 |
| | 7.2 චරිත ස්වභාවය ප්‍රදර්ශනය වන පරිදි අංග රචනය කරයි. | • සත්ත්ව චරිත , මිනිස් චරිත | සත්ත්ව හා මිනිස් චරිතවල ස්වභාවය ප්‍රදර්ශනය වන පරිදි සිද්ධියකට අනුව නර්තන නිර්මාණය කරයි. | 05 |
| | 7.3 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි රංගවස්ත්‍රාභරණ ආකෘතියක් නිර්මාණය කරයි. | • රංගවස්ත්‍රාභරණ ආකෘතියක් නිර්මාණය | රංග වස්ත්‍රාභරණ නිර්මාණය කිරීමේ හුරුව ලබයි. | 03 |
| 8.0 නර්තන කලාවෙන් ලැබෙන මානසික හා ශාරීරික ස්වස්ථතාව සාර්ථක දිවි පෙවෙතක් ගතකිරීමට ඉවහල් කර ගනියි. | 8.1 මානසික සවස්ථතාව පවත්වා ගැනීමේ වැදගත්කම විස්තර කරයි. | • සමබර පෞරුෂ වර්ධනය<br>–නිවැරදි ව තීරණ ගැනීම<br>-නිර්මාණශීලී ව කටයුතු කිරීම<br>–විවේකය නිසි අයුරින් ගත කිරීම<br>–ශාරීරික නීරෝගි භාවය | නර්තන කලාවෙන් ලැබෙන මානසික ස්වස්ථතාව පවත්වා ගැනීමේ වැදගත්කම අධ්‍යයනය කරයි. | 02 |
| | 8.2 මානසික ස්වස්ථතාව පවත්වා ගැනීමට නර්තන ක්‍රියාකාරකම් ඉවහල් වන අයුරු විමසයි. | • නර්තන ක්‍රියාකාරකම්- නර්තන , ගායන, වාදන අංගවල නිරත වීම | ශාරීරික ස්වස්ථතාව පවත්වා ගැනීමට ක්‍රියාකාරී ව කටයුතු කරයි. | 02 |
| | | | | 85 |

## I වාරය

| ක්‍රියාකාරකම් අංක | | කාලච්ඡේද |
|---|---|---|
| 2.3.1 | වන්නම් නර්තනය කරමු. | 02 |
| 4.1.1 | නිර්දිෂ්ට ජනකවි ගායනාවල පසුබිම විස්තර කරමු. | 06 |
| 4.2.2 | රබන් හා වන්නම් කවි ගයමින් සතුටු වෙමු. | 02 |
| 1.2.1 | රබන්/චාමර නැටුමක් නිර්මාණය කරමු. | 05 |
| 2.1.1 | සරඹ දක්වමින් කුසලතා ප්‍රදර්ශනය කරමු. | 04 |
| 3.1.1 | බෙර වාදනයට දෑත හුරුකර ගනිමු. | 03 |
| 5.1.1 | නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු විමසමු. | 02 |
| 2.2.1 | අලංකාර පද ගොඩ නගමු. | 03 |
| | | 27 |

## II වාරය

| ක්‍රියාකාරකම් අංක | | කාලච්ඡේද |
|---|---|---|
| 2.3.1 | වන්නම් නර්තනය කරමු. | 02 |
| 2.4.1 | බෙර පද හා කවි ප්‍රස්තාර කරමු. | 03 |
| 1.1.1 | ජීවන වෘත්තියක් නර්තන නිර්මාණයෙන් ඔපවත් කරමු. | 05 |
| 5.3.1 | සොකරි ගැමි නාටකය පිළිබඳ තතු විමසා බලමු. | 02 |
| 6.2.1 | කලා කෘතියක රස මිහිර පවසමු. (කරදිය/කුම්භකතාව) | 04 |
| 7.2.1 | වේදිකා නර්තනයකට උචිත අංග රචනයක් ගොඩ නගමු. | 03 |
| 7.1.1 | වේදිකා නාට්‍ය ගීයට නර්තන නිර්මාණය කරමු. | 04 |
| 4.2.1 | ඔන්චිලි වාරම් හා චාමර කවි ගයමු. | 02 |
| 3.2.1 | සන්නිවේදන කාර්යය සඳහා වාද්‍ය භාණ්ඩ යොදා ගැනීම පිළිබඳ තොරතුරු උගනිමු. | 02 |
| 8.1.1 | නර්තනයෙන් මනස සුවපත් කර ගනිමු. | 02 |
| | | 29 |

## III වාරය

| ක්‍රියාකාරකම් අංක | | කාලච්ඡේද |
|---|---|---|
| 2.3.2 | සම්ප්‍රදාය රැකගනිමින් නර්තනයේ යෙදෙමු. | 03 |
| 2.5.1 | සතර අභිනය | 02 |
| 5.2.1 | නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූවන් අගයමු. | 02 |
| 1.3.1 | විස්මය නමැති ස්ථායිභාවය නිරූපණය කරමු. | 03 |
| 4.2.3 | නමස්කාර ගාථා හා ටීකා සීපද ගයමු. | 02 |
| 5.4.1 | කොහොඹා යක් කංකාරිය, දෙවොල් මඩුව හා පහන් මඩුව ශාන්තිකර්ම පිළිබඳ තොරතුරු තුලනාත්මක ව ඉදිරිපත් කරමු. | 04 |
| 7.2.2 | සත්ත්ව චරිත සඳහා සරල අංගරචනයක් කරමු. | 02 |
| 6.3.1 | කථකලි නර්තනයෙහි තතු විමසමු. | 02 |
| 7.3.1 | සාම්ප්‍රදායික රංග වස්ත්‍රාභරණ කට්ටලයක ආකෘතියක් හදමු. | 03 |
| 6.1.1 | ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය කලාවේ ප්‍රභවයට බලපෑ කරුණු විමසා බලමු. | 04 |
| 8.2.1 | "නිසිසේ නටමු. සුවසේ වෙසෙමු." | 02 |
| | | 29 |

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 1.0** : පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ප්‍රදේශයේ පවත්නා වෘත්තීන් තේමා කරගනිමින් නර්තන නිර්මාණ කරයි.

**ක්‍රියාකාරකම 1.1.1** : ජීවන වෘත්තියක් නර්තන නිර්මාණයෙන් ඔපවත් කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

**ඉගෙනුම් පල 1.1.2** :

- ප්‍රදේශයේ පවත්නා ජීවන වෘත්තීන් නම් කරයි.
- අදාළ වෘත්තියේ ක්‍රියාකාරකම් පෙළ ගස්වයි.
- තෝරාගත් වෘත්තියේ එන ක්‍රියාකාරකම්වල සුවිශේෂ ලක්ෂණ පිළිබඳ අදහස් දක්වයි.
- විවිධ අවස්ථාවන්ට උචිත චලන යොදා ගනිමින් නිර්මාණ ගොඩනගයි.
- තේමාවට අදාළ නිමාවක් සහිත නර්තන අංගයක් ඉදිරිපත් කරයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්හි දී සාමූහිකත්වයෙන් යුතු ව කටයුතු කරයි.
- ඉදිරිපත් කරන නිර්මාණ පිළිබඳ විචාරාත්මක ව අදහස් දක්වයි.
- තම නිර්මාණ පිළිබඳ ව අන් අය දක්වන විචාරයන්ට ගරු කරමින් ප්‍රතිචාර දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : වාද්‍ය භාණ්ඩ, ඇමුණුම අංක 1

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : ඇමුණුම අංක 1 හි සඳහන් කර ඇති ක්‍රියා පිළිවෙළ තවදුරටත් සංවර්ධනය කරගැනීමට අවකාශය ඇති බව සලකන්න.

**පියවර 1** :

- ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි දක්නට ලැබෙන ධීවර/මැටි/පතල්/තේ/කොහු/කෘෂි වැනි කර්මාන්ත පිළිබඳ සාකච්ඡා කිරීම.
- එක් මාතෘකාවක් තෝරාගෙන එහි සුවිශේෂ ලක්ෂණ හා එම වෘත්තියේ ස්වභාවය අනුව ක්‍රියාකාරකම් පෙළගස්වා එක් එක් අවස්ථාවන්හි ප්‍රදර්ශනය වන චලන ස්වභාවය, රංග රටා නිර්මාණය, අවකාශ භාවිතය පිළිබඳ සාකච්ඡා කිරීම.

**පියවර 2** :

- ඇමුණුම අංක 1 කණ්ඩායම්වලට ලබා දී නර්තන නිර්මාණය සඳහා යොමු කරවීමට මග පෙන්වීම හා සිසු නිර්මාණ ඵලදායි කරගැනීම සඳහා බෙර වාදනයෙන් සහාය වීම.

**පියවර 3** :

- එක් එක් කණ්ඩායම්වලට තම නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම.
- එම නිර්මාණ පිළිබඳ විචාරශීලී අදහස් හා සංවර්ධනාත්මක යෝජනා සාකච්ඡා කර නව යෝජනා හා අදහස් අනුව නර්තන නිර්මාණ පෝෂණය කරගැනීමට මග පෙන්වීම.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

කණ්ඩායම් ක්‍රියාකාරකම් අභ්‍යාස කිරීමට අවස්ථාව ලබා දී ඇගයීම කරන්න.

- අදාළ වෘත්තියේ චලන ක්‍රියාකාරකම් පෙළගැස්වූ සටහන ඉදිරිපත් කරන්න.
- කණ්ඩායම් නර්තන නිර්මාණ ඉදිරිපත් කරන්න.

**ඇමුණුම අංක 1**

1. ධීවර කර්මාන්තය - දියඹට ඔරුව රැගෙන යෑම, දැල් එළීම, දැල් ඇදීම, මාළු රැස් කිරීම, මාළු වර්ග කිරීම, අලෙවිය හා සතුටු වීම.

2. මැටි කර්මාන්තය - මැටි කැපීම, මැටි පෑගීම, සකපෝරුවේ වළං සෑදීම, වළං තැලීම, පෝරණුවට වළං දැමීම, විවිධ භාණ්ඩ නිෂ්පාදනය, අලෙවිය හා සතුටු වීම.

3. පතල් කර්මාන්තය - පතලට යාම, පතල කැණීම, ඉල්ලම් ගැරීම, මැණික් වෙන් කිරීම, විවිධ ආභරණ නිෂ්පාදනය, අලෙවිය හා සතුටු වීම.

4. තේ කර්මාන්තය - පැල සිටුවීම, ගස් කප්පාදු කිරීම, දළු නෙලීම, දළු වේලීම, කුඩුකර ගැනීම, අලෙවිය හා සතුටු වීම.

5. කොහු කර්මාන්තය - පොල් ලෙලි එකතු කර දියට දැමීම, පොල් ලෙලි තැලීම, පොල් කොහු වෙන් කිරීම, ලණු ඇඹරීම, වර්ණ ගැන්වීම, විවිධ භාණ්ඩ නිෂ්පාදනය අලවිය හා සතුටු වීම.

6. කෘෂි කර්මාන්තය - බිම සකස් කිරීම, පැළ සිටුවීම, පැළ නඩත්තුව, අස්වනු නෙලීම, අස්වනු ගබඩා කිරීම, අලෙවිය හා සතුටු වීම.

**නිපුණතාව 1.0** : පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණ කරයි.

**නිපුණතා මට්ටම 1.2** : ගැමි නැටුම් හා සබැඳි විශේෂ ලක්ෂණ හඳුනාගනිමින් නර්තන නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 1.2.1** : රබන්/චාමර නැටුමක් නිර්මාණය කරමු .

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

**ඉගෙනුම් පල 1.2.2** :

- රබන්/චාමර නැටුමේ සුවිශේෂ ලක්ෂණ හඳුන්වයි.
- රබන්/චාමර නර්තනයට උචිත චලන නිර්මාණය කරයි.
- රංග උපකරණ නිවැරදි ව හසුරුවමින් නර්තන ඉදිරිපත් කරයි.
- සාමූහිකත්වයෙන් යුතු ව නිමාවක් සහිත රබන්/චාමර නර්තන අංගයක් ප්‍රදර්ශනය කරයි.
- රබන්/චාමර නර්තන නිර්මාණ පිළිබඳ විචාරාත්මක ව අදහස් ඉදිරිපත් කරයි.
- තම නිර්මාණ පිළිබඳ ව අන්‍යයන් දක්වන විචාරයන්ට සවන් දී ඊට ප්‍රතිචාර දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙරය, තාලම්පට, අත් රබන්/චාමර

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

**පියවර 1** :

- උගත් රබන්/චාමර කවියක් ගායනා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දී රබන්/චාමර නැටුමේ සුවිශේෂ ලක්ෂණ සාකච්ඡා කිරීම.
- රබන්/චාමර හසුරු වන ආකාරය ප්‍රදර්ශනය කර රබන්/චාමර නිසි ලෙස හැසිරවීමට මග පෙන්වීම.

**පියවර 2** :

- සිසුන් සංඛ්‍යාව අනුව කණ්ඩායම් කර රබන්/චාමර නර්තන නිර්මාණයට අවස්ථාව ලබා දීම.
- බෙර වාදනයට අනුව නර්තන අභ්‍යාස කිරීමට යොමු කරවීම.

**පියවර 3 :**

- කණ්ඩායම් වශයෙන් සිසු නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී නර්තන නිර්මාණවල ගායනය, චලනවල උචිත බව, උපකරණ හැසිරවීම, අවකාශ භාවිතය, සාමූහික බව නිර්මාණාත්මක බව, සමස්ත නිමාව පිළිබඳ විචාරාත්මක ව අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී ඒ පිළිබඳ සාකච්ඡා කිරීම.

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

බෙර වාදනයට අනුව අභ්‍යාස කිරීමට අවස්ථා ලබා දී ඉන් පසු ව ඇගයීම කරන්න.

- රබන්/චාමර නර්තනය දැකිය හැකි අවස්ථා නම් කරන්න.
- රබන්/චාමර නැටුමේ සුවිශේෂ ලක්ෂණ හඳුන්වන්න.
- රබන්/චාමර නර්තනයට උචිත චලන නිර්මාණය කරන්න.
- නිර්මාණය කරන ලද නර්තන අංග ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 1.0** : පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණය කරයි

**නිපුණතා මට්ටම 1.3** : භාව ප්‍රකාශ වන පරිදි චරිත නිරූපණය කරයි.

**ක්‍රියාකාරකම 1.3.1** : විස්මය නමැති ස්ථායිභාවය නිරූපණය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල 1.3.2** :

- විස්මය නමැති ස්ථායිභාවය ප්‍රකාශ කළ යුතු ආකාරය පිළිබඳ අදහස් දක්වයි.
- විස්මය නමැති ස්ථායිභාවය ප්‍රකාශ කිරීමට සුදුසු සිද්ධියක් ගොඩනගයි.
- විස්මය නමැති ස්ථායිභාවය ප්‍රකාශ කිරීමට උචිත චලන නිර්මාණය කරයි.
- එම චලන උපයෝගී කරගනිමින් චරිත නිරූපණය කරයි.
- භාව ප්‍රකාශනය තුළින් චරිත ස්වභාවය තීව්‍ර කර දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : පින්තූර/DVD

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : සුදුසු ප්‍රවේශයක් භාවිත කරමින් විස්මය නමැති ස්ථායීභාවය ප්‍රදර්ශනය කිරීම.

**පියවර 1** :

- විස්මය නමැති ස්ථායිභාවය ප්‍රදර්ශනය කිරීමේ දී භාවිත වන අංග, ප්‍රත්‍යංග, උපාංග පිළිබඳ සාකච්ඡා කිරීම. උපාංග භාවිත කරමින් ඉදිරිපත් කරන චලන භාව ප්‍රකාශන තීව්‍ර කිරීමට ප්‍රබල ව බලපාන බව සාකච්ඡා කිරීම.

**පියවර 2** :

- විස්මය නමැති ස්ථායිභාවය නිරූපණය කිරීමට සුදුසු සිද්ධියක් නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දීම. එක් එක් සිසුවා විසින් සටහන් කරන ලද නිර්මාණාත්මක සිද්ධි අතරින් කිහිපයක් තෝරා ගෙන ඒ පිළිබඳ විචාරාත්මක ව සාකච්ඡා කිරීම.

**පියවර 3** :

- එක් සිද්ධියක් තෝරා ගෙන විස්මය නමැති ස්ථායිභාවය නිර්මාණය කිරීමට අවස්ථාව ලබා දීම.

**පියවර 4** :

- සිසු නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී ඉදිරිපත් කළ නිර්මාණ පිළිබඳ විචාරාත්මක අදහස් හා යෝජනා ඉදිරිපත් කර ඒ පිළිබඳ සමාලෝචනය කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- විස්මය නමැති ස්ථායිභාවයෙන් උපදින රසය නම් කරන්න.
- විස්මය නමැති ස්ථායිභාවය ඉදිරිපත් කළ හැකි කෙටි සිද්ධියක් නිර්මාණය කරන්න.
- විස්මය නමැති ස්ථායිභාවය ප්‍රදර්ශනය කරන්න.

**නිපුණතාව 2.0** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** : සාම්ප්‍රදායික නර්තනය හා සබැඳි හස්ත-පාද හැසිරවීමේ විධික්‍රම අනුගමනය කරමින් මූලික සරඹ ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 2.1.1** : සරඹ දක්වමින් කුසලතා ප්‍රදර්ශනය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල 2.1.2** :

- ත්‍රිවිධ ලය අනුව නියමිත ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද තාල තබමින් කියයි.
- අදාළ කස්තිරම්/ඉරට්ටි තාල තබා කියයි.
- අදාළ ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද හා කස්තිරම්/ඉරට්ටි ත්‍රිවිධ ලය හා බෙර වාදනයට අනුව ඉදිරිපත් කරයි
- නර්තන ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල ප්‍රවීණත්වය ලැබීමට සතතාභ්‍යාසයේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- නිවැරදි විධික්‍රම අනුගමනය කරමින් ගොඩ සරඹ/ඉලංගම් සරඹ දොඹින පදවලට අදාළ කස්තිරම්/ඉරට්ටි හා හමාර පදය ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : තාලම්පට, බෙරය, ඇමුණුම අංක 1

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : ප්‍රායෝගික ක්‍රියාකාරකමෙහි ශිෂ්‍යසාධන මට්ටම පිළිබඳ අවධානය යොමු කරන්න.

**පියවර 1** :

- 6-9 ශ්‍රේණිවල දී ඉගෙනගන්නා ලද ගොඩ සරඹ/ඉලංගම් සරඹ දොඹින පද හා අදාළ කස්තිරම්/ඉරට්ටි සමූහ ක්‍රියාකාරකමක් ලෙස විලම්භ හා මධ්‍ය ලයට බෙර වාදනයට අනුව නර්තනය කිරීමට සැලැස්වීම.

- සිසු නර්තනය නිරීක්ෂණය කර ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද හා අදාළ කස්තිරම්/ඉරට්ටි හා හමාර පදය නර්තනයේ දී නිවැරදි අංගහාර හා බෙර වාදනයට අනුව ලය ප්‍රගුණ කිරීම පිළිබඳ කෙටි සාකච්ඡාවක් මෙහෙයවීම.

**පියවර 2** :

- 10,11, සහ 12 ගොඩ සරඹය/ඉලංගම් සරඹය/දොඹින පදය ලියන ලද ඇමුණුම ප්‍රදර්ශනය කිරීම හා එම සරඹ පද විලම්භ මධ්‍ය ද්‍රැත ලයට අනුව තාල තබා කීමට සිසුන් යොමු කරවීම.
- සරඹ පදවලට අදාළ කස්තිරම්/ඉරට්ටි තාල තබා කීමට සැලැස්වීම.

**පියවර 3**

- 10 වන ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද සිසුන් විසින් තාල තබමින් කියන විට ගුරුවරයා විසින් නිවැරදි විධික්‍රම අනුගමනය කරමින් නර්තනයේ යෙදීම හා සිසුන් නිරීක්ෂණයේ යෙදවීම.
- පියවරෙන් පියවර නර්තනය කරමින් සිසුන් නර්තනයට යොමු කරවීම.
- කස්තිරම/ඉරට්ටිය පියවරෙන් පියවර නර්තනය කරවීම.

- සිසුන් නර්තනයේ යෙදෙන විට ගුරුවරයා වාදනයෙන් සහාය වීම.
- 11 සහ 12 ගොඩසරඹ/ඉලංගම් සරඹ/දොඹින පද හා අදාළ කස්තිරම්/ඉරට්ටි හා හමාර පදය ඉහත ආකාරයට අභ්‍යාස කරවීම.
- 10,11,12 ගොඩසරඹ/ඉලංගම් සරඹ/දොඹින පද හා අදාළ කස්තිරම්/ ඉරට්ටි සටහන් කරගැනීමට අවස්ථාව ලබා දීම.
- 10,12 දක්වා ගොඩසරඹ/ඉලංගම් සරඹ/දොඹින පද ත්‍රිවිධ ලයට අනුව නර්තනය කිරීමට හා අදාළ කස්තිරම්/ඉරට්ටි අභ්‍යාස කිරීමට අවස්ථාව ලබාදීම.
- පන්තියේ සියලු ම සිසුන්ට ක්‍රියාකාරකම ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.
- සිසුන් නර්තනයේ යෙදෙන විට ගුරුවරයා වාදනයෙන් සහාය වීම කණ්ඩායම් වශයෙන් හෝ ඒකල වශයෙන් සතතාභ්‍යාසයේ යෙදීමට උපදෙස් දීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- 10,11,12 ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද තාල තබා කියන්න.
- 10,11,12 ගොඩ සරඹ/ඉලංගම් සරඹ/දොඹින පද ත්‍රිවිධ ලය හා බෙර වාදනයට අනුව ඉදිරිපත් කරන්න.
- කස්තිරම්/ඉරට්ටි බෙර වාදනයට අනුව ඉදිරිපත් කරන්න
- 10,11,12 ගොඩසරඹ/ඉලංගම් සරඹ/දාඹින පද නිවැරදි විධි ක්‍රම අනුගමනය කරමින් ප්‍රදර්ශනය කරන්න.
- සතතාභ්‍යාසයේ වැදගත්කම පිළිබඳ අදහස් දක්වන්න.

ඇමුණුම 1

**උඩරට නර්තන සම්ප්‍රදාය - ගොඩ සරඹ**

10 - බඹර සරඹය

පදය - දොම් කිට /// කිට දොම්
කස්තිරම - තකට තකට තක තරිකිට කුන්දත් තා - තක ජී ජී කුඳ //
තකට තකට තක තරිකිට කුන්දත් //
තකට තකට තක තරිකිට කුන්දත් තා.

11 - පැනීම් සරඹය

පදය - දොම්කිට කිට දොම්
කස්තිරම - තක්කඩ කඩතක ජිජි කුඳ - ජික්කඩ කඩතක ජිජි කුඳ
තොංකඩ කඩතක ජිජි කුඳ - නංකඩ කඩතක ජිජි කුඳ
තක්කඩ කඩතක ජික්කඩ කඩතක
තොංකඩ කඩතක නංකඩ කඩතක
තක්කඩ ජික්කඩ තොංකඩ නංකඩ
තත් ජිත් තොං නං තා.

12 - චන්ද්‍රිකා සරඹය

පදය - දොම් කිට /// කිට දොම්
කස්තිරම - තත් තත් තක්කඩ කඩතක ජිත් ජිත් ජික්කඩ කඩතක
තොං තොං තොංකඩ කඩතක නං නං නංකඩ කඩතක
තත් තක්කඩ කඩතක ජිත් ජික්කඩ කඩතක
තොං තොංකඩ කඩතක නං නංකඩ කඩතක
තක්කඩ කඩතක ජික්කඩ කඩතක
තොංකඩ කඩතක නංකඩ කඩතක
තක්කඩ ජික්කඩ තොංකඩ නංකඩ
තත්ජිත් තකජිත් තත්ජිත් තොන්නං තා.

**පහතරට නර්තන සම්ප්‍රදාය - ඉලංගම් සරඹ**

10 - පදය - ගුහිති ගදිරිකිට ගුඳ ගුඳ ගුම් දිත් තා
ගහිති ගදිරිකිට ගත ගත ගත් දිත් තා

ඉරට්ටිය - ගුහිති ගදිරිකිට ගුඳ ගුඳ ගුදිත ගුදිත් තත් //
ගුහිති ගදිරිකිට ගුඳ ගත් ///
දොම් දිත් තා

11 - පදය - ර් .... රිම් දැහිං රෙගදිත ගත ගුඳ ගත්තම්

ඉරට්ටිය - රිම් ගත ගුඳ ගත් තම් රිම් ගත ගුඳ ගත් තම්
ගත් දැහිං ගුං දැහිං ගුදිත ගුඳම්
ගදිත ගුඳම් දොම්ත ගතං ගත
ගුදිතක දෙගුඳක දූහිං

12 - පදය - ගුදිත ගුම් දූහිං (දිතගත) ගදිතකු දොම්
ර් ...... රිම්ගත ගදිගත ගත්ත ගදිත ගත්
ගුදිතක දිගුදකු දොම්

ඉරට්ටිය - ගුදිත ගදිත ගත ගත් දූහිං ගුං දූහිං
දොංතකු දොංතකු දොං
තරිකිට තත් දිරිකිට තත් ගුදිත ගතත් දොං
ගදිත ගතත් දොං දොංත ගදිත ගත
ගුදිතක දිගුදකු දොං

**සබරගමු නර්තන සම්ප්‍රදාය - දොඹින පද**

10 - පදය - කිත් තා කිත් තා ජෙජ් ජෙජ්තා
තත්කඩ තරිකිට// ජෙජ් ජෙං තා-

11 - පදය - තරිකිට දිරිකිට දිරිකිට තරිකිට

12 - පදය - තරිකිට දිරිකිට දිරිකිට තරිකිට
දිරිකුං තරිකුං තරිකිට දිරිකිට

හමාර පදය - තෙයා /////
තෙයියත් තාම් තේයි තාම්

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි .

**නිපුණතා මට්ටම 2.2** : සාම්ප්‍රදායික චලන භාවිත කරමින් අලංකාර පද (මාත්‍රා) නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 2.2.1** : අලංකාර පද ගොඩ නගමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල 2.2.2** :

- අලංකාර පද (මාත්‍රා) නර්තනය සඳහා සුදුසු චලන නිර්මාණය කරයි
- නිර්මාණය කරගත් චලන යොදාගනිමින් සුළු මහ (මාත්‍රා 2+4) දෙතිතට අලංකාර පද (මාත්‍රා) නිර්මාණය කරයි.
- වාදනයට අනුව අලංකාර පද (මාත්‍රා) නර්තනයේ යෙදෙයි.
- නිර්මාණය කරන ලද අලංකාර පද (මාත්‍රා) වෙනත් නර්තන අවස්ථා සඳහා භාවිත කරයි.
- ගොඩනගන ලද අලංකාර පද (මාත්‍රා) පිළිබඳ විචාරාත්මක අදහස් ඉදිරිපත් කරයි.
- නිර්මාණය කරන ලද අලංකාර පද (මාත්‍රා) සාමූහික ව ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : උඩරට පහතරට සබරගමු බෙර, තාලම්පට

**ක්‍රියාකාරකම සැලසුම් සඳහා උපදෙස්:**

**පියවර 1 :**

- සුළු මහ (මාත්‍රා 2+4) දෙතිතට අයත් සාම්ප්‍රදායික නර්තන අංගයක් ප්‍රදර්ශනය කිරීම. එහි තාලය හා නර්තනයෙහි සාම්ප්‍රදායික චලන පිළිබඳ සාකච්ඡා කිරීම.

**පියවර 2 :**

- සාම්ප්‍රදායික චලන ඇසුරු කරගනිමින් සුළු මහ (මාත්‍රා 2+ 4) දෙතිතට අනුව අලංකාර පද (මාත්‍රා) නිර්මාණය කිරීමට සිසුන් යොමු කරවීම.
- නිර්මාණය කරගත් අලංකාර පද ඒකල වශයෙන් හෝ කුඩා කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.

**පියවර 3 :**

- නිර්මාණය කරන ලද අලංකාර පද පිළිබඳ විචාරාත්මක ව ඇගයීමට ලක් කිරීම හා තවදුරටත් සංවර්ධනය කරගැනීමට උපදෙස් ලබා දීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සාම්ප්‍රදායික චලන ඇසුරින් සුළු මහ (මාත්‍රා 2+ 4 ) දෙතිතට අනුව අලංකාර පද (මාත්‍රා) නිර්මාණය කරන්න.
- වාදනයට අනුව අලංකාර පද නර්තනය කරන්න.
- අලංකාර පදයක් නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.3** : නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම 2.3.1 : වන්නම් නර්තනය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල 2.3.2** :

- අදාළ තිත් රූපය අනුව සිංහරාජ, සැවුලා/අනුරාග දණ්ඩතාලය, නාතිලිංචි තාලය/විරාඩි, මණ්ඩූක වන්නම්වල තානම් හා කවි ගායනය කරයි.
- නියමිත නාදමාලාව අනුගමනය කරමින් ගායනය කරයි.
- තානම හා කවි ගායනය කරමින් නර්තනයේ යෙදෙයි.
- කස්තිරම/ඉරට්ටිය/කලාසම, සීරුමාරුව, අඩව්ව නර්තනය කරයි.
- වාදනයට අනුව තානම කවිය ගායනා කරමින් නර්තනයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙරය, තාලම්පට වන්නම් ලියන ලද සටහන්

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : ඔබ උගන්වන නර්තන සම්ප්‍රදායට අදාළ වන්නම් තෝරා ගත යුතු ය. 9 ශ්‍රේණියේ උගත් වන්නම සම්පූර්ණ කර 10 ශ්‍රේණියට අදාළ වන්නම ස්වාධීන ව ගයමින් නර්තනය කිරීමට අවශ්‍ය ශක්‍යතා වර්ධනය කර තිබේ දැයි බලන්න.

**පියවර 1** :

- ගායනය පාඩමේ දී උගත් වන්නමේ තානම, ගායනය කිරීමට යොමු කරවීම.
- නර්තනයේ දී වන්නම ගායනය කිරීමේ අවශ්‍යතාව විස්තර කිරීම.

**පියවර 2** :

- වන්නමට අදාළ පද කොටස් ඉගෙනීමට සැලැස්වීම.
- කස්තිරම/ඉරට්ටිය/කලාසම/සීරුමාරුව සහ අඩව්ව ගුරුවරයා නර්තනය කිරීම හා සිසුන් නර්තනයට යොමු කරවීම.

**පියවර 3** :

- වාදනයට අනුව තානම හා කවි ගායනය කරමින් සමූහ වශයෙන් හා ඒකල වශයෙන් නර්තනයෙහි යෙදවීම.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

සතතාභ්‍යාසයෙන් පසු ව ඇගයීම කරන්න.

- නිවැරදි අංගහාර අනුගමනය කරමින් වාදනයට අනුව අදාළ වන්නම නර්තනය කරන්න.

## උඩරට - සිංහරාජ වන්නම

තාලය - මහ (මාත්‍රා 4) තනි තිත

බෙර පදය - දො දොංත තකු දොං

තානම - තනත් තනෙන තම් - දනත් තනෙන තම් දනත් තනෙන තම් දන තානා ....තන
තනත් තනෙන තම් - දනත් තනෙන තම් දනත් තනෙන තම් දන තානා .........

කවිය - පෙරත් කලෙක සිංහ රජෙක් වැටුනි මහ ලිඳක් තුළක ඉබි ලඩෙක් කරපු වැඩ
ඇරත් මෙහෙම යස වැඩක් උනේ නැත චිරත් කලෙක පැවතුමක් යසයි හැඩ
දුරත් බැලුම නොව ලඟත් බලන අය හටත් මෙලෙස වෙයි කැටත් තබම් දඩ
වටත් අයට දැනෙ නටත් කියම් මම රටක් වටින සිංහ රජ වන්නමෙ හැඩ

කස්තිරම - තකට තකට තක තරිකිට කුන්දත් ///
රැන්තක ජින්තක ජිංතක ජිං කුඳ ///
තාග් ගජිංතක තරිකිට කුන්දත් //
රැන්තක ජිංතක තරිකිට කුන්දත් තා.

සීරුමාරුව - තකු තක ජිජි කුඳ ගජිත ගජිත කුඳ
ගජි ගත කුඳ කුඳ තා (කඩතක)
කුඳ කුඳ තා (කඩතක)
කුඳ කුඳ තාකු ජින්ත ගත දොම්කිට
තරිකිට කුන්දත් තා.

අඩව්ව - තාම් දොම්ති ගත දොම් කිට
කඩතක තරිකිට කිතක දොම්ති ගත කිත් තක්
කුඳ කුඳ තාකු ජිත්ත ගත දොම්කිට
තරිකිට කුන්දත් තා.

## පහතරට - අනුරාගදණ්ඩ තාලය

තාලය - මහ (මාත්‍රා 4) තනි තිත

බෙර පදය - තක දිත් තක දොං දොං දිං තක දොං

තානම - තෙන තෙන තෙන තෙනෙනා තෙනම් තෙන
තෙන තෙන තෙන තෙනෙනා

කවිය - තාරඟනා මැදිනා දිසි සුබ්‍රකරා ලෙස සොම් ගුණෙ නා
ඒ රාවණා රාවන නැගි ශක්‍ර සුරා සුර සමගිව නා
තෝරම්නා කිරනා නිසි අග්‍ර මිනෙවු කිරුලක දර නා
නාරායන නිතිනා දිසි දීර්සති ලෝසත රැක දෙම් නා

ඉරට්ටිය - තක දිත් තක දොං කිත් තත් කිට්තක
තරිගත දිකුදං දොම්ත දොම්ත ගත
තක්‍රතත් ගුහිතිග දිරිකිට තා

## සබරගමු - විරාඩි වන්නම

| | | |
|---|---|---|
| තාලය | - | මහ (මාත්‍රා 4) තනි තිත |
| දවුල් පදය | - | ජිමිත කුදා දොං |
| තානම | - | තානා තනතම් තන තන තනතම් දන තානා<br>තීනා තිනතිම් තින තින තිනතිම් තින තී නා |
| කවිය | - | පානා යසසින් සිරිපිරි කුළුනෙන් හිඳ වාරාඩී<br>බූනා රජසිත් එක ලෙස නිරතුරු වීවාඩී<br>ගානා හිමිසිත් පිනවන යසසින් නෙක වාරාඩී<br>සේනා මැද විත් කී මේ වන්නම දනු විරාඩී |
| කලාසම | - | කුදිත ගතිත කුඳ ගති ගත කුඳ ගත //<br>කුදිත ගතිත කුඳ ගතිත කුදිත් තත් |
| අඩව්ව | - | ගත්තකු දිත්තා දොංගඩ තරිකිට ජිත්තා<br>දොංකුඳ ගතකුඳ ගතකුඳ ගතකුඳ<br>තක්කඩ ජික්කඩ දොංගඩ තරිකිට<br>දොංත දොංත ගත ගතිගත දිරිකිට තරිකිට තා<br>ජිමිත්තත් ගතිගත හර්ජික් ගතකුං තා |

## උඩරට - සැවුලා වන්නම

| | | |
|---|---|---|
| තාලය | - | සුළු මහ (මාත්‍රා 2 + 4) දෙතිත |
| බෙර පදය | - | දොං දොං ජිං ජිං ගජිගත |
| තානම | - | තම් තම්දන තානම් දන තම්දන තානම්<br>තම් තම්දන තානත් තෙයි තම්ද නා තම්දෙ නා නා |
| කවිය | - | සුරිඳුන් පෙර සිටන් බලයුත් සවතිඳුන්<br>සහගොස් කළ යුදෙන් අසු රන්ජය නොලදින්<br>බර අත් ගෙන කගින් ඇන කොන්තවි වලින්<br>අසුරන් කළ යුදෙන් ජය ගෙන කඳ කුමරුන්<br><br>ගසමින් කග පතින් දෙපලුව අසුර සෙන්<br>දැරුපා අතළුවෙන් පලු දෙක ගෙන සැනකින්<br>එම වන් පලුවකින් එ උපන් සැනයකින්<br>සැවුලා නම එයින් ලොව පළ කළ උපතින් |
| කස්තිරම | - | කුඳ ගජිගත /// කුඳ තා<br>කුඳ ගජිගත /// කුඳ තා<br>කුඳ ගජිගත කුඳ තා //<br>කුඳ තා //<br>කුඳ ගජිගත /// කුඳ තා / |
| සීරුමාරුව | - | තකු තක තරිකිට කුංදත්<br>ගත් ජිත් තක ජිත් කුංදත්<br>තකු තක තරිකිට කුන්දත් දොං තා |
| අඩව්ව | - | ජෙන් තත් තත් ///ජෙන් තා - ජෙනු තත් තත් /// ජෙනු තා<br>ජෙන් තත් තත් ජෙන් තා - ජෙනු තත් තත් ජෙනු තා<br>ජෙන් තා - ජෙනු තා<br>දොහොකඩ තා - දොහොකඩ ගත කුඳ දොහොකඩ තා |

**පහතරට - නාතිලිංචි තාලය**

| | | |
|---|---|---|
| තාලය | - | සුළු මහ (මාත්‍රා 2 + 4 ) දෙතිත |
| බෙර පදය | - | දොම් තම් ගත ගදි තම් ගත ගුගු දම් ගත ගදිතම් |
| තානම | - | තෙන තෙම්තෙන<br>තෙන තෙම්තෙන<br>තෙන තෙම්තෙන තෙනෙනා |
| කවිය | - | සඳ සන්දර දිගු පුන්ගිර දිළිමන් ඔබ යස ටා<br>සඳ සන්දර පැරදුන මෙන් සැඟවී මෙර ගිර ටා<br>සඳ සන්දර නව මන්තර අදහාගත් ලෙස ටා<br>සඳ සන්දර පතිවල්ලභ සෙත දෙන් සව් සත ටා |
| ඉරට්ටිය | - | දොම් තත් දිම් ගත ගුගු දිත<br>ගත ගුහි තිග දිරි කිට<br>දොම් ගතගත ගුං දා |

**සබරගමු - මණ්ඩුක වන්නම**

| | | |
|---|---|---|
| තාලය | - | මැදුම් මහ (මාත්‍රා 3 + 4) දෙතිත |
| දවුල් පදය | - | කුඳත් තක්කිට තකට ජිං තක |
| තානම | - | තෙයිය තනත් තනෙනා //<br>තෙයිය තනා තන තානත් තත්<br>තොං නං කිත් තත්<br>තෙයිය තනත් තහනා // |
| කවිය | - | අවිය රැගෙන යුදයට ආ විලසට //<br>දෙවියනි පෙර සිට/// තිබුණේ මෙලෙසට<br>තෙයිය තනත් තහනා//<br>හයියෙන් කීවොත් වන්නම ඔබිනට //<br>අයියෝ මෙවන්නම/// කියාදියන් මට<br>තෙයිය තනත් තහනා<br><br>අහස් කුසේ වැසි ගුවනින් එන විට//<br>දහස් ගණන් විල/// ගිය සක්වල වට<br>තෙයිය තනත් තහනා//<br><br>උදහස් වී රිවි පායන විලසට//<br>දහස් ගණන් හැඬු///<br>මණ්ඩුකයෝ සිට තෙයිය තනත් තහනා |
| කලාසම | - | ජිංත ගත ගත ගතිත කුඳ කුඳ ///<br>ජිංත ගත කුඳ ගතිත කුඳ ගත් |
| අඩව්ව | - | ජිංත ගත් තත් ගතිත ගත දොං<br>ජිංත ගත ගත ගතිත ගත දොං<br>ජිංත ගත් තත් ගතත් කුඳ ගත<br>තා ගත් තත් ගතත් කුඳ ගත තා |

**නිපුණතාව 2.0** : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.3** : නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තනාංග ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම 2.3.2** : සම්ප්‍රදාය රැකගනිමින් නර්තනයේ යෙදෙමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල 2.3.2** :

- වට්ටමේ/ගමන් මාත්‍රයේ අනන්‍යතා ලක්ෂණ විස්තර කරයි.
- නියමිත තිත් රූප මත වට්ටම් පිරීම, පද, කස්තිරම්, අඩව්/අන්තාඩිය, ඉරට්ටිය/කලාසම් වට්ටම, අඩව්ව තාල තබමින් කියයි.
- නියමිත අංගහාර අනුගමනය කරමින් නර්තනය කරයි.
- වාදනයට අනුව ඒකල හා සාමූහික ව නර්තනය ඉදිරිපත් කරයි.
- ශිල්පීය ප්‍රාගුණ්‍යය වර්ධනයට සතතාභ්‍යාසය වැදගත් බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ගැට බෙරය/පහතරට බෙරය/දවුල, තාලම්පට හා දෘශ්‍යාධාර

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :** ඔබ උගන්වන සම්ප්‍රදායට අදාළ නිර්දේශිත කොටස් තෝරාගත යුතු ය.

උඩරට - දොං ජිංත ගත දොංත වට්ටම - වට්ටම් පිරීම, පද 02, කස්තිරම් 02, අඩව් 02

පහත රට - ගුඳ ගති ගත වට්ටම - පද 02, අන්තාඩිය, ඉරට්ටි 02

සබරගමු ගමන් මාත්‍රය - පද, කලාසම් වට්ටම, කලාසම, අඩව්ව

**පියවර 1 :**

- ගුරුවරයා විසින් දොං ජිංත ගත දොංත/ගුද ගති ගත වට්ටම/සබරගමු ගමන් මාත්‍රයට අයත් පද ප්‍රදර්ශනය කර එහි සුවිශේෂ අනන්‍යතා ලක්ෂණ විස්තර කිරීම.
- නියමිත තිත් රූප අනුව වට්ටම් පිරීම, පද, කස්තිරම්, අඩව්/මාත්‍රා, අන්තාඩිය, ඉරට්ටි/කලාසම් වට්ටම, කලාසම, අඩව්ව තාල තබා කීමට යොමු කරවීම.

- ගුරුවරයා විසින් වට්ටම් පිරීම, පදය, කස්තිරම, අඩව්ව/මාත්‍රා, අන්තාඩිය, ඉරට්ටිය /ගමන් මාත්‍රය පද කලාසම් වට්ටම, අඩව්ව ප්‍රදර්ශනය කර නර්තනය සඳහා යොමු කරවීම.

**පියවර 2 :**

- බෙර/දවුල් වාදනයට අනුව වට්ටම් පිරීම, ගමන් මාත්‍රය පද කලාසම් වට්ටම, අඩව්ව අභ්‍යාස කරවීම.
- වාදනයට අනුව නියමිත පද කොටස් අභ්‍යාස කරවීම හා නිවැරදි අංගහාර අනුගමනය කිරීමට මග පෙන්වීම.
- සතතාභ්‍යාසයෙහි අවශ්‍යතාවය පිළිබඳ සාකච්ඡා කරමින් සාමූහික වශයෙන් අභ්‍යාසයේ යෙදීමට උපදෙස් දීම.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්** : උගන්වන නර්තන සම්ප්‍රදායට නිර්දේශිත විෂය කොටස් තෝරා ගන්න.

- වට්ටමට/ගමන් මාත්‍රයට අදාළ තාල රූපය නම් කරන්න.
- නියමිත තාල රූපය අනුව පද කොටස් තාල තබා කියන්න.
- වාදනයට අනුව සාමූහික ව නර්තනය කරන්න.
- ඒකල වශයෙන් වට්ටම/ගමන් මාත්‍රය නර්තනය කරන්න.

## විෂය අන්තර්ගතය

### උඩරට නර්තන සම්ප්‍රදාය

### දොංජිංත ගත දොංත වට්ටම - තාලය- සුළු මැදුම් (මාත්‍රා 2 + 3) දෙතිත

| | | |
|---|---|---|
| වට්ටම් පිරීම | - | තෙහිං තෙහිංත ගජි ජිකුඳ ගත් ජිත් ගජිං ජිකුඳ<br>තෙහිං තෙහිංත ගජි ජිකුද දොං තා. |
| 1. වට්ටම් මාත්‍රය | - | දොං ජිංත ගත දොංත |
| කස්තිරම | - | කුඳ ගජිත කුඳ තා. |
| අඩව්ව | - | තත් තකට තක රොං<br>තක්කඩ තක්කඩ කුඳ තක රොං<br>තක රොං ගජිං ජිකුඳ කිටි තකට කුන්දත් ජික රොං |
| 2. වට්ටම් මාත්‍රය | - | දොං ජිංත ගත දොංත |
| කස්තිරම | - | කුඳ ගජිත /// කුඳ තා |
| අඩව්ව | - | තාත් ජිං තත් තත් ජිං තත් ජිං තත් තත්<br>දොහොකඩ තහකඩ දොම්කිට කුඳ<br>ගත කුකුද - ජිත් තෙහිං<br>තහර්ජිත් තහර්ජිත් කුඳ තහර්ජිත් තහර් දොං |

### පහතරට නර්තන සම්ප්‍රදාය

### ගුඳ ගති ගත වට්ටම - තාලය- සුළු (මාත්‍රා 2) තනි තිත

| | | |
|---|---|---|
| 1. පදය | - | ගුඳ ගති ගත ගුඳ ගුඳ ගති ගත |
| අන්තාඩිය | - | ගුඳ ගති ගත ගුඳ ගත් තම් |
| ඉරට්ටිය | - | ගුංදත් ගහිති ගදිරිකිට ගත ගත ගහිති ගතම්<br>තත් දිත් තත් දිගතම් දොං (ගති ගත) |
| 2. පදය | - | ගුඳ ගති ගත ගුඳ ගුඳ ගති ගත |
| අන්තාඩිය | - | ගුඳ ගති ගත ගුඳ ගත් තම් |
| ඉරට්ටිය | - | ගුංදත් ගහිති ගදිරිකිට ගත ගත // ගහිති ගතම්<br>තත් දිත් තත් දිගතම් දොං (ගති ගත) |

**සබරගමු නර්තන සම්ප්‍රදාය**

**ගමන් මාත්‍රය - තාලය- මැදුම් (මාත්‍රා 3) තනි තිත**

1. දවුල් පදය - ජිං කිටි තත් තත් කිටිතක

කලාසම් වට්ටම - කුදිත ගතිත තත් කුදගත කුදිත ගතිත
ගත කුද දොං

කලාසම - ජිංත ගතත් තත් කුඳගත ///
ගදිත කුදිත් තත් කිත් තත්

අඩව්ව - තත් කිටහර් ජික් කිට කුං
තත් කිත්තත් ගත කිත් තත්
ගති කිටහර් ජික් කිට කුං
තත් කිත්තත් ගත කිත් තත්
දෝංත ගත්තත් කිටිතක
තකුද ගතත් කුඳගත කුද තා

**නිපුණතාව 2.0** : නර්තන හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.4** : ප්‍රස්තාරකරණයේ විධි ක්‍රම අනුගමනය කරයි.

**ක්‍රියාකාරකම 2.4.1** : බෙර පද හා කවි ප්‍රස්තාර කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල 2.4.2** :

- නියමිත කවි ගායන සහ නර්තන පද ප්‍රස්තාර කිරීමේ විධික්‍රම සාකච්ඡා කරයි.
- විධික්‍රම හා විවිධ ශිල්ප ක්‍රම භාවිත කරමින් අදාළ කවි හා නර්තන පද කොටස් ප්‍රස්තාර කරයි.
- නිවැරදි ව ප්‍රස්තාරකරණයේ යෙදෙමින් තාල පිළිබඳ ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.
- තුන් තිතේ ප්‍රභේද හඳුන්වයි.

**ගුණාත්මක යෙදවුම්** : අදාළ විෂය කොටස් අන්තර්ගත සටහන්

**ක්‍රියාකාරම සැලසුම් කිරීම සඳහා උපදෙස්** : සාම්ප්‍රදායික නර්තන අංග පාඩමේ දක්වා ඇති වන්නම් හා වට්ටම් ද, ගායන පාඩමේ දක්වා ඇති රබන් කවි හා චාමර කවි ද ප්‍රස්තාර කරණය සඳහා යොදා ගන්න.

- ප්‍රස්තාරකරණය පිළිබඳ සිසු දැනුම විමසමින් සරල තිත් රූප, විභාග වෙන් කොට දැක්වීමේ දී කොටස් හතරක් භාවිත කිරීම, කවි පදවල යෙදී ඇති මාත්‍රා ලඝු, ගුරු වශයෙන් වෙන් කොට හඳුනාගැනීම හා නියමිත ස්ථානවල සංඥා සලකුණු යෙදීම පිළිබඳ සාකච්ඡා කිරීම.

**පියවර 1** :

- අදාළ වන්නම්, වට්ටම්, රබන් කවි, චාමර කවි ප්‍රස්තාරකරණය සඳහා සිසුන් යොමු කිරීම.

**පියවර 2** :

- ප්‍රස්තාර සටහන් නිරීක්ෂණය කර හරි වැරදි බලා සකස් කර අවශ්‍ය නම් නැවත ප්‍රස්තාර කිරීමට යොමු කරවීම.

**පියවර 3** :

- තුන්තිතේ ප්‍රභේද හඳුන්වා දීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- අදාළ බෙර පදයක්, කවියක්, කස්තිරමක්/ඉරට්ටියක්/කලාසමක් හා අඩව්වක් ප්‍රස්තාර කරන්න.
- තුන්තිතේ ප්‍රභේද නම් කරන්න.

**නිපුණතාව 2.0** : නර්තන හා බැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.5** : නර්තන කලාව හා බැඳි ප්‍රකාශන විධික්‍රම අධ්‍යයනය කරමින් අදහස් දක්වයි.

**ක්‍රියාකාරකම 2.5.1** : සතර අභිනය.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල 2.5.2** :
- ප්‍රකාශන විධික්‍රම ලෙස සතර අභිනය භාවිත වන බව ප්‍රකාශ කරයි.
- සතර අභිනය විස්තර කරයි.
- ප්‍රේක්ෂක රස වින්දනය උදෙසා සතර අභිනය වැදගත් වන බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙරය/තාලම්පට/ශාන්තිකර්ම පෙළපාලි ඇතුළත් CD තැටියක් /එම ඡායාරූප/රස භාව දැක්වෙන දෘශ්‍යාධාර

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 1** :
- කලින් සැලසුම් කරන ලද හෝ අවස්ථානුකූල ව නිර්මාණය කරන ලද සිදුවීමක් ඇසුරින් ආංගික, සාත්ත්වික, වාචික, ආහාර්ය අභිනය ප්‍රදර්ශනය කරමින් ඒ පිළිබඳ විමසීම.

**පියවර 2** :
- සතර අභිනය පිළිබඳ කරුණු විස්තර කිරීම.
- ප්‍රේක්ෂක රසවින්දනයෙහි ලා සතර අභිනයෙහි වැදගත්කම හා තේමාව මතු කිරීමට, ප්‍රාසංගික බව තීව්‍ර කිරීමට, ප්‍රකාශනමය ගුණය මතු කිරීමට සතර අභිනය ඉවහල් කරගන්නා ආකාරය විස්තර කිරීම හා අවශ්‍ය කරුණු සටහන් කරගැනීමට සැලැස්වීම.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සතර අභිනය නම් කරන්න.
- සතර අභිනය විස්තර කරන්න.
- නර්තන නිර්මාණයන්හි සාර්ථකත්වයෙහි ලා සතර අභිනය ඉවහල් වන අයුරු විස්තර කරන්න.

**නිපුණතාව 3.0** : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.1** : නිවැරදි ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් බෙර වාදනය කරයි.

**ක්‍රියාකාරකම 3.1.1** : බෙර වාදනයට දෑත හුරුකර ගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල 3.1.2** :

- 01, 02 බෙර/දවුල් සරඹ පද තාල තබමින් කියයි.
- නිවැරදි අක්ෂර උත්පාදනය වන ආකාරයට බෙර/දවුල් සරඹ පද වාදනය කරයි.
- විලම්භ, මධ්‍ය ලය අනුගමනය කරමින් බෙර/සරඹ පද වාදනය කරයි.
- සුළු මැදුම් (මාත්‍රා 2 + 3 ) දෙතිතට බෙර, දවුල් පද වාදනය කරයි.
- සාමූහික ව හා ඒකල ව හඬ පාලනය කරමින් වාදනය ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙර, තාලම්පට

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : බෙර සරඹ 02 ක් සහ සුළු මැදුම් (මාත්‍රා 2 + 3) දෙතිත ට අදාළ පද කොටස් ඇසුරු කරගන්න.

**පියවර 1** :

- සතර බීජාක්ෂර වාදනය කර කෙටි සාකච්ඡාවක් මෙහෙයවා සතර බීජාක්ෂර වාදනය කිරීමට මග පෙන්වීම හා බෙරවාදනයේ දී අනුගමනය කළ යුතු විධි ක්‍රම හඳුන්වාදීම.
- තාල තබා සරඹ පදය කීමට හා විලම්භ, මධ්‍ය ලයට සරඹ පද වාදනය කිරීමට යොමු කරවීම.

**පියවර 2** :

- සුළු මැදුම් (මාත්‍රා 2 + 3) දෙතිතට බෙර පදයක් වාදනය කර සිසුන් ට තාල තැබීමට අවස්ථාව ලබා දීම හා බෙර පද වාදනය කිරීමට යොමු කරවීම.

**පියවර 3** :

- සතර බීජාක්ෂර, පළමු හා දෙවන බෙර සරඹ විලම්භ, මධ්‍ය ලයට වාදනය කිරීම. සුළු මැදුම් (මාත්‍රා 2+3) දෙතිතට බෙර පද වාදනය අභ්‍යාස කරවීම.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

අභ්‍යාස කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දී ඉන්පසු ඇගයීමට ලක් කරන්න.

- සතර බීජාක්ෂර වාදනය කරන්න.
- සුළු මැදුම් (මාත්‍රා 2 + 3) දෙතිතට අදාළ බෙර පද වාදනය කරන්න.
- පළමු හා දෙවන බෙර/දවුල් සරඹ පද පද විලම්භ, මධ්‍ය ලයට වාදනය කරන්න.

## සතර බීජාක්ෂර

| | | |
|---|---|---|
| උඩරට | - | ත, ජී, තො, න<br>(තත්, ජිත්, තොං, නං) |
| පහතරට | - | ත, දි, තො, න<br>(තත්, දිත්, තොං, නං) |
| සබරගමු | - | ත, ජී, තො, න<br>(තත්, ජිත්, තොං, නං) |

## බෙර සරඹ

| | | |
|---|---|---|
| උඩරට | - | 1. තකට<br>2. තකට කුදට |
| පහතරට | - | 1. ගුහිති<br>2. ගුහිති ගහිති |
| සබරගමු | - | 1. තකට<br>2. තකට ජිකට |

## සුළු මැදුම් දෙතිතට බෙර පද

| | | |
|---|---|---|
| උඩරට | - | දොං ජිංත ගත දොංත |
| පහතරට | - | ගුං දෙගත ගත්ත ගුං |
| සබරගමු | - | ජිං ජිමිත තත් තකට |

**නිපුණතාව 3.0** : සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ හඳුනාගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.2** : සන්නිවේදන කාර්යය සඳහා වාද්‍ය භාණ්ඩ භාවිත කළ අවස්ථා විස්තර කරයි.

**ක්‍රියාකාරකම 3.2.1** : සන්නිවේදන කාර්යය සඳහා වාද්‍ය භාණ්ඩ යොදාගැනීම පිළිබඳ තොරතුරු උගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල 3.2.2** :

- සන්නිවේදන කාර්යය සඳහා අතීතයේ සිට ම දේශීය වාද්‍ය භාණ්ඩ භාවිත කළ බව ප්‍රකාශ කරයි.
- සන්නිවේදන ක්‍රියාවලිය මුල් කොටගෙන වාදන අවස්ථා නම් කොට ඇති බව ප්‍රකාශ කරයි.
- එම සන්නිවේදන අවස්ථා ආගමික හා සාමාජීය වශයෙන් වර්ග කර දක්වයි.
- ආගමික හා සාමාජීය සන්නිවේදන අවශ්‍යතා සඳහා භාණ්ඩ භාවිතයේ දී විවිධ උපක්‍රම යොදාගත් ආකාරය විස්තර කරයි.
- වර්තමානයේ විවිධ සමාජ අවශ්‍යතාවල දී මෙම වාද්‍ය භාණ්ඩ යොදා ගන්නා බවට කරුණු ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ගැට බෙරය, පහතරට බෙරය, දවුල, රබාන, ශ්‍රව්‍ය පට.

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

**පියවර 1** :

- තෝරාගත් බෙරපද කොටසක් හෝ මඟුල් බෙර, මළ බෙර වාදන ඇතුළත් හඬ පටයක් ශ්‍රවණයට සැලැස්වීම.
- ශ්‍රවණය කරන ලද පද කොටස් පිළිබඳ සිසු අදහස් විමසීම. අතීතයේ මෙන් ම වර්තමානයේ ද දේශීය වාද්‍ය භාණ්ඩ විවිධ සාමාජීය, ආගමික හා වෙනත් අවශ්‍යතා සඳහා යොදාගත් අවස්ථා නම් කිරීම. (උදා: අණ බෙර, රණ බෙර, මළ බෙර, වද බෙර, තේවා වාදන, හේවිසි වාදන, රබන් වාදන) අවස්ථා නම් කිරීම.

**පියවර 2** :

- සිසුන් කණ්ඩායම් කර, ඇමුණුම් 01 ලබා දී ඇගයීම හා තක්සේරුකරණයේ දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු ගොනු කිරීමට යොමු කරවීම.

**පියවර 3** :

- කණ්ඩායම් වශයෙන් පිළිතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම.
- එම පිළිතුරු ඇසුරින් තවදුරටත් කරුණු දක්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සන්නිවේදනය සඳහා භාවිත වාද්‍ය භාණ්ඩ නම් කරන්න.
- සන්නිවේදනය සඳහා දේශීය වාද්‍ය භාණ්ඩ වාදනය කළ අවස්ථා නම් කරන්න
- වාදනය කිරීමේ දී ඒ ඒ අවස්ථාවන් හා බැඳි විධි ක්‍රම විස්තර කරන්න.
- මෙම වාදන අංග සංරක්ෂණය සඳහා සුදුසු ක්‍රියා මාර්ග හතරක් යෝජනා කරන්න.

**ඇමුණුම 01**

අතීතයේ පටන් වර්තමානය දක්වා ශ්‍රී ලාංකිකයෝ විවිධ අවශ්‍යතා උදෙසා දේශීය වාද්‍ය භාණ්ඩ ඇසුරු කර ගත්හ. අතීතයේ ස්තූප පූජා, බෝධි පූජා, ධාතු නිධානෝත්සව, ගිරිභණ්ඩ පූජා, දියකෙළි, දඩ කෙළි වැනි උත්සව හා සමාජ කටයුතු මෙහි ලා වැදගත් වේ.

හේවිසි හා තේවා වැනි වාදන ආගමික කටයුතු සඳහා භාවිත විය. අණ බෙර, මළ බෙර, වද බෙර, මගුල් බෙර, රබන් වාදන, සාමාජීය කටයුතු උදෙසා භාවිත විය. රණ බෙර යුධමය අවස්ථාවල දී භාවිත විය.

**ඇමුණුම 02**

මෙම වාදනය මූලික වශයෙන් ම සන්නිවේදන කාර්ය අරමුණු කරගත් අතර, භාවිත කිරීමේ දී හඬ පාලනය සඳහා විවිධ උපක්‍රම යොදා ගනු ලැබී ය. උදා: මළබෙර වාදනයේ දී දවුල සුදු පිරුවටයකින් වැසීම.

විවිධ සමාජ අවස්ථා අනුව වාදනයට යොදාගන්නා වාද්‍ය භාණ්ඩ විවිධ වන අතර, ඒවා වාදනයේ දී විවිධ මනෝභාව මතු කිරීමෙහි ලා සමත් වේ. මළබෙර හා වද බෙර වාදනයෙන් කරුණ රසයත්, රණ බෙර වාදනයෙන් වීර රසයත් ලබා දීමට වාදකයෝ උත්සාහ ගනිති.

වර්තමානයේ විවිධ ආගමික, සාමාජීය, සංස්කෘතික සංදර්ශන හා සංගීත කටයුතු සඳහා වාද්‍ය භාණ්ඩ යොදා ගන්නා අතර, මෙම වාදන අවස්ථා සංස්කෘතික වශයෙන් ශ්‍රී ලාංකේය ජන සමාජයේ ප්‍රබල වටිනාකම් හිමි කරගනී. විවිධ අවස්ථාවල දී වාදනය කරනු ලබන වාද්‍ය භාණ්ඩ විවිධ වන්නා සේ ම විවිධ පද කොටස් ද අවස්ථානුකූල ව වාදනය කරනු ලැබේ. එම පද වාදනය මගින් ප්‍රබල සන්නිවේදනයක් සිදු වේ.

**නිපුණතාව 4.0** : ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 4.1** : නිර්දේශිත ගායන හා බැඳි සංස්කෘතික පසුබිම විස්තර කරයි.

**ක්‍රියාකාරකම 4.1.1** : නිර්දිෂ්ට ජනකවි ගායනවල පසුබිම විස්තර කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල 4.1.1** :

- රබන් හා වන්නම් කවි ගායන හා බැඳි පසුබිම කෙටියෙන් දක්වයි.
- චාමර හා ඔංචිලි වාරම් කවි ගායනවල පසුබිම විමසයි.
- නමස්කාර ගාථා හා ටීකා සීපද කවි ගායනවල පසුබිම විස්තර කරයි.
- නිර්දිෂ්ට මෙම කවි ගායනවල වටිනාකම හඳුනාගනිමින් ඒවා සංරක්ෂණය කිරීමට යෝජනා ඉදිරිපත් කරයි.
- අදාළ කවි ගායනය කරමින් එම කවි ගායනවල සුවිශේෂ ලක්ෂණ ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : බෙර, තාලම්පට හා අදාළ කවි සටහන්

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : මෙම ක්‍රියාකාරකමට අදාළ කාලච්ඡේද 06 වාර තුනට දෙක බැගින් වෙන් කරගන්න. වාර සටහනෙහි ක්‍රියාකාරකම් බෙදා දක්වා ඇති ආකාරය හඳුනාගන්න. ගායනයට පෙර ඒ පිළිබඳ අවබෝධය ලබා ගත හැකි වන පරිදි වඩාත් සුදුසු හා නිවැරදි ලෙස ක්‍රියාකාරකම සැලසුම් කරගන්න. I වාරය රබන් හා වන්නම් කවි, IIවාරය- චාමර හා ඔන්චිලි වාරම් කවි, III වාරය- නමස්කාර ගාථා හා ටීකා සීපද

**පියවර 1**

- අදාළ කවි ශ්‍රවණයට සැලැස්වීම හා ගායනය කරමින් එම කවි හඳුන්වා දීම.

**පියවර 2**

- අදාළ කවි නිර්මාණය කිරීමට බලපෑ කරුණු, එම කවි ගායනවල ඇති වෙනස්කම්, සුවිශේෂ නාද රටා, අසාතාත්මක, අනාසාතාත්මක ලක්ෂණ, ජන සමාජය හා මෙම කවි අතර ඇති සබඳතා, කවි සංරක්ෂණය කිරීමට ගත හැකි පියවර පිළිබඳ සාකච්ඡා කිරීම.

**පියවර 3**

- අදාළ කවි ගායනය කිරීමට සලස්වා එම කවිවල සුවිශේෂ ලක්ෂණ ඇගයීමට ලක් කිරීම හා සංරක්ෂණය කිරීම පිළිබඳ සිසු අදහස් විමසමින් සාකච්ඡා කර අවශ්‍ය තොරතුරු සටහන් කර ගැනීමට යොමු කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

මෙම කවි ගායන ක්‍රියාකාරකම් වාර තුනට අදාළ බැවින් ඇගයීමේ දී ඒ ඒ වාරයට නිර්දේශිත ගායන ඇගයීමට සැලසුම් කරන්න.

- රබන් හා වන්නම් කවි ගායනවල පසුබිම විස්තර කරන්න.
- රබන් කවියක් හෝ අදාළ වන්නමේ තානම හා කවිය ගයමින් එහි සුවිශේෂ ලක්ෂණ හඳුන්වන්න.
- චාමර හා ඔන්චිලි වාරම් කවිවල ගායනවල පසුබිම විමසන්න.
- නමස්කාර ගාථා හා ටීකා සීපද ගයමින් එම ගායනවල සුවිශේෂ ගායන ලක්ෂණ විස්තර කරන්න.

**නිපුණතාව 4.0** : ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැඳි ගායනවල පසුබිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 4.2** : නියමිත නාදමාලාව අනුගමනය කරමින් ජන ගායන ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 4.2.1** : ඔන්චිලි වාරම් හා චාමර කවි ගයමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල 4.2.1** :

- ඔංචිලි වාරම් කවි හා චාමර කවි නිවැරදි නාදමාලාවට අනුව ගායන කරයි.
- නියමිත බෙරපද අනුව තාල තබමින් අදාළ කවි ගායනය කරයි.
- බෙර වාදනයට අනුව තාල තබමින් ඔන්චිලි වාරම් කවි හා චාමර කවි ගායනය කරයි.
- සාමූහිකත්වයෙන් යුතු ව ඒකීය හඬතලයක පිහිටා ගායනය කරයි.
- ස්වකීය හඬතලය හසුරුවාගනිමින් ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ශ්‍රව්‍ය පට, ඩිමයි කොළ, ඇමුණුම්

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්**: විවිධ ප්‍රවේශ හා ඉගෙනුම් ක්‍රම භාවිත කරමින් ඔන්චිලි වාරම් කවි හා චාමර කවි මාතෘකා යටතේ වෙන් වශයෙන් ක්‍රියාකාරකම් සැලසුම් කරගන්න.

**පියවර 1** :

- ගුරුවරයා විසින් ඔංචිලි වාරම් කවි හා චාමර කවි ගායනය කරමින් ඒ පිළිබඳ සාකච්ඡා කිරීම.
- කවි සහිත ඇමුණුම සිසුන් අතරේ බෙදා දීම.
- ඔංචිලි වාරම් කවි හා චාමර කවි ගායන කරවීම. කණ්ඩායම් වශයෙන් පුහුණු වීමට සැලැස්වීම හා උපදෙස් ලබා දීම.

**පියවර 2** :

- එක් එක් කණ්ඩායම බැගින් ඔන්චිලිවාරම් කවි හා චාමර කවි ගායනය කිරීමට සැලැස්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

ක්‍රියාකාරකම් අවසානයේ ක්ෂණික ඇගයීමක් කර අවශ්‍ය සුදුසු අවස්ථාවක දී පහත සඳහන් ප්‍රශ්න අනුව ඇගයීම කරන්න.

- නියමිත නාදමාලාවට අනුව ඔන්චිලි වාරම් කවියක් ගායනය කරන්න.
- නියමිත මාලාවට අනුව චාමර කවියක් ගායනය කරන්න.
- කණ්ඩායම් වශයෙන් ඔන්චිලි වාරම් කවි හා චාමර කවි ගායන ඉදිරිපත් කරන්න.

**ඔංචිලි වාරම් කවි**

1. පුරවර මැද බැඳි රන් ඔන්චිල්ලා දුර යන තරමට පුදුම නොවෙල්ලා
   වැර සර පිරිමින් තව පැදපල්ලා සුරපුර දෙවියන් රැකුමෙ සියල්ලා

2. අට දෙන අට කොණ වාඩි වෙයල්ලා සිටගෙන දෙදෙනෙක් පොලු පාගල්ලා
   වච්ලන් ලෙස කැරකෙන ඔන්චිල්ලා අපිත් පදිමු මේ රන් ඔන්චිල්ලා

සොබමන් දෙව් වරු සදෙනෙක් එතනට
බසිමින් චාමර ගත්තේ සුරතට
ගනිමින් චාමර සැලුවේ මුනිඳුට
අපි දැන් දක්වමු ඒ රඟ සබයට

චාමර නර්තනය සඳහා ඉහත කවිය භාවිත කරන අතර චාමර නර්තනය රාජ සභා ලක්ෂණ ගන්නා නිසා නර්තනයේ දී ප්‍රශස්ති කවි ද භාවිත කරයි.

උදා: ජය ජය සිංහ නරේන්ද්‍රා රක්ෂ රක්ෂ - ජය ජය සිංහ සුරේන්ද්‍රා
ජය ජය සිංහ සුරේන්ද්‍රා රක්ෂ රක්ෂ - ජය ජය කන්ද සුරින්ද්‍රා
පාදපත්ම අසුරන් ඔද බින්දා - සිරිහස් දූරු වේලා අවියෙන්දා
ගත්තද නෙත් දොල සින්දා රක්ෂ රක්ෂ - දෙව් රැකදෙන් සුර කන්දා

**නිපුණතාව 4.0** : ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැඳි ගායනවල පසු බිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 4.2** : නියමිත නාදමාලාව අනුගමනය කරමින් ගායන ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 4.2.2** : රබන් හා වන්නම් කවි ගයමින් සතුටු වෙමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල 4.2.2** :

- නියමිත නාදමාලාවට අනුව රබන් කවි ගායනය කරයි.
- නියමිත නාදමාලාව අනුගමනය කරමින් වන්නම් ගායනය කරයි.
- බෙර වාදනයට අනුව තාල තබමින් රබන් හා වන්නම් කවි ගායන කරයි.
- ඒකීය හඬ තලයක පිහිටා සාමූහික ව ගායනය කරයි.
- ස්වකීය හඬ තලය හඳුනාගනිමින් ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ශ්‍රව්‍ය පට, දෘශ්‍ය පට, පින්තූර

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්:** රබන් හා වන්නම් කවි ගායනය ක්‍රියාකාරකම් වෙන් වෙන් වශයෙන් සැලසුම් කරගන්න.

**පියවර 1** :

- රබන් කවි ශ්‍රවණයට සැලැස්වීම.
- ශ්‍රවණය කරමින් ගායනයේ යෙදීමට අවස්ථාව සැලසීම.
- කණ්ඩායම් වශයෙන් නිවැරදි නාදමාලාව අනුව ගායනයට යොමු කරවීම.

**පියවර 2** :

- අදාළ වන්නම ශ්‍රවණයට සැලැස්වීම.
- කණ්ඩායම් වශයෙන් ගායනය කිරීමට අවස්ථාව සැලසීම.
- බෙර වාදනය අනුව තාල තබමින් ගායනය කරවීම.
- නැවත නැවත ගායන අභ්‍යාසයට අවස්ථාව ලබාදීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- තාල තබමින් නිවැරදි ව රබන් කවියක් ගායනය කරන්න.
- වන්නම නිවැරදි නාදමාලාව අනුව ගායනය කරන්න.
- ඒකීය හඬ තලයක පිහිටා කණ්ඩායම් වශයෙන් වන්නම හා රබන් කවියක් ගායනය කරන්න.
- බෙර වාදනයට අනුව තාල තබමින් වන්නමේ තානම, කවිය හා රබන් කවි ගායනය කරන්න.

**රබන් කවි**

- නම් උතුන් පෙම්බර ගුණ රුසිරු රබානා
  දැන් මෙමන් අතින් රැගෙන කරකවමි මනා
  පෙම් සිතින් බලනු මැනවි දෙනෙත් පාමිනා
  සන්තොසින් අසනු මැනවි කීම වෙන වෙනා

- අතකට ගෙන රබන් පොඩිය වයති දිසි රුවින්
  ගතසිත බඳ සොලවා සිලි සිලි නද කරමින්
  සිතකටවත් නොගෙන රඟති විදුලිය විලසින්
  අහසට දමමින් අල්ලා රබාන දැතින්

- ත්‍රිවිධ ඥාන විදුරු පඬි අපෙ මහ ගෞතම නම් මුනිඳු ........
  එ බුදු වූ ගෞතම නම් මුනිඳු ........

  දෙසූ දහම් ඇසුමට ඒ නිමලා - විසූ භවය යකුගෙන් තතු දැනලා
  නසා ලන්ට කිව් දිවි අසලා බණ - දෙසූ විදුර පණ්ඩිතමයි ගෞතම

  එදා එ ඇතු විදුමට ආ වැදි හට - පුදා එ දළ දෙක දී ලා දැතට
  සදා එ බුදු බව පැතු මාතා හට - පුදා වදිමු අපි මල් ගෙන දෝතට

- රටකට මව් සමගින් එනැව් නැග යන කල අපෙ මුණිඳුන්
  මකරෙට ගැසූ සුළඟින් එනැව බිඳ සමුදුර මැද ගිලුනෙන්
  උරපිට මව් තබමින් සතියක් පීනල ගොඩ නැගුනෙන්
  අටවිසි මුනිඳු බලෙන් අපහට අවසර ලැබෙනු සබෙන්

(අදාළ වන්නම් සඳහා 11-12-13 පිටු බලන්න.)

**නිපුණතාව 4.0** : ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා බැඳි ගායනවල පසු බිම අධ්‍යයනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 4.2** : නියමිත නාදමාලාව අනුගමනය කරමින් ගායන ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 4.2.3** : නමස්කාර ගාථා හා ටීකා සීපද ගයමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල 4.2.2** :

- නමස්කාර ගාථා හා ටීකා සීපද කවි නියමිත නාද මාලාවට අනුව ගායනය කරයි.
- ඒකීය හඬතලයක පිහිටා ඒකල ව හා සාමූහික ව නමස්කාර හා ටීකා සීපද කවි ගායනය කරයි.
- ස්වකීය හඬතලය හඳුනාගනිමින් කවි ගායන ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ශ්‍රව්‍ය පට, කවි ලියන ලද පුවරු/පත්‍රිකා

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : ගුණාත්මක යෙදවුම් භාවිත කරමින් සුදුසු ඉගෙනුම් ක්‍රමවේද අනුව ක්‍රියාකාරකම් දෙකක් ලෙස සැලසුම් කරන්න.

**පියවර 1 :**

- 4.1 නිපුණතා මට්ටම හා බැඳි ක්‍රියාකාරකමේ දී උගත් නමස්කාරගාථා හා සබැඳි සංස්කෘතික පසුබිම පිළිබඳ තොරතුරු විමසමින් කෙටි සාකච්ඡාවක් මෙහෙයවීම.
- නමස්කාර ගාථාවක් ශ්‍රවණයට සලස්වා පදයෙන් පදය ගායනයට යොමු කරවීම.
- නිවැරදි නාදමාලාව අනුගමනය කරමින් අභ්‍යාස කිරීමට මග පෙන්වීම.

**පියවර 2 :**

- ටීකා සී පද කවියක් ශ්‍රවණයට සැලැස්වීම.
- ගද්‍ය හා පද්‍ය ලක්ෂණ තහවුරු වන සේ අදාළ නාදමාලාවට අනුව ටීකාව ගයමින් සිසුන් ගායනයට යොමු කරවීම.
- ටීකා සී පද කවි ගායන අභ්‍යාසකර ඉදිරිපත් කිරීම සඳහා මග පෙන්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

ඇගයීම් අවස්ථා දෙකක දී ඉටු කරන්න.

- නිවැරදි නාදමාලාවට අනුව නමස්කාර ගාථා ඉදිරිපත් කරන්න.
- ගද්‍ය හා පද්‍ය ලක්ෂණ මතු වන අයුරින් ටීකා සී පද කවියක් ඉදිරිපත් කරන්න.
- ඒකීය හඬ තලයක පිහිටා සාමූහික ව කවි ගායනය කරන්න.
- ස්වකීය හඬතලය හඳුනාගනිමින් කවි ගායනය කරන්න.

**නමස්කාර ගාථා**

01. සම්මා සම්බුද්ධ ඥානේන - සම්මා සම්බුද්ධ දේසනා
සම්මා සම්බුද්ධ ලෝකස්මිං - සම්මා සම්බුද්ධ තේ නමෝ

02. මේරුං විරාජිත සමං විය බුද්ධ රාජං
සිරි දන්ත සාගර සමං විය ධම්ම රාජං
සත්තකුඨපබ්බත සමං විය සංඝ රාජං
සිරි බුද්ධ ධම්ම ගුණ සංඝ වරං නමාමි

ඉහත නමස්කාර ගාථාවෙහි දෙවැනි පාදයේ **සිරි දන්ත** සහ තුන්වැනි පාදයෙහි **සත්තකුඨ** යන වචන නිවැරදි ය. ගායන ව්‍යවහාරයේ දී **ශ්‍රී දන්ත** හා **සත්කුල** යනුවෙන් භාවිත කෙරේ.

**ටීකා සී පද**

- හෙමින් හෙමින් .............
  තව ද ............ ඌරන්ට, මුවන්ට, ගෝනුන්ට, සාවුන්ට වෙඩි තියන්න
  වල්පාරක් දිගේ කිට්ටු කරගෙන යන්නා වාගේ .............
  හෙමින් හෙමින් මම ගේකට යන කලට .............
  එකෙක් ඇවිත් .............
  තව ද ............. අත්තා, මුත්තා, නත්තා, පනත්තා, කිත්තා, කිරිකිත්තා, සෝළියා, පාඬියා කාලේ මහා උස්
  කනාටු ගහකින් පොල් ගෙඩි පණහක් හැටක් සිඳ හෙලන්නා වාගේ .............
  එකෙක් ඇවිත් ............. දුන්නයි මගේ ............. පිට මැදට
  එගුටි කකා .............
  තව ද ............. නැන්දා මාමාගේ ගෙදර ගොස්
  හොද්දක් බතක් මාලුවක් කෑවා වාගේ .............
  එගුටි කකා ............. මම පිට වී යන කලට .............
  මම්ම මටම ඉල ඇට නැත
  තව ද නැන්දා, මාමා, ආච්චි, ආතා, හූරා, නෑනා සමග සන්තෝෂ වේලාවක දී
  කොක් හඬලා සිනාසෙන්නා වාගේ .............
  මම්ම මටම ඉලඇට නැත හිනාවට .............

- උන්තැන අටයි .............
  උන්තැන අටයි තරිකිට දොද්දොං තා
  උන්තැන අටයි දිරිකිට දොද්දොං තා
  උන්තැන අටයි දිත් තරිකිට දොං තා .............

  තම් තම්දන තන දම්දන තනත්තනා නා තම්දන
  ඉහළ වෙලේ යන නෑනෝ-පහළ වෙලේ යන නෑනෝ
  ඉහළ වෙලේ ගොන් බානයි - පහළ වෙලේ ගොන් බානයි
  අල්ලපියෝ ............. අල්ලපියෝ .............
  තම්දන තම් දාන තානෙනා .............
  උන්තැන අටයි සිටිතැන නවයයි පාද .............

**නිපුණතාව 5.0** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැකගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 5.1** : නර්තන කලාව හා සබැඳි ඓතිහාසික පසුබිම විග්‍රහ කරයි.

**ක්‍රියාකාරකම 5.1.1** : නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු විමසමු

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල 5.1.2** :

- වංස කථා හා විදේශිකයන්ගේ වාර්තාවලින් නර්තන කලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු අනාවරණය කරගත හැකි බව ප්‍රකාශ කරයි.
- නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලැබූ බව ඓතිහාසික මූලාශ්‍රයවල ඇති සාධක මගින් ඉදිරිපත් කරයි.
- ආගමික හා සාමාජීය අවශ්‍යතා සඳහා නර්තන භාවිත කළ අයුරු ඓතිහාසික මූලාශ්‍රයවල සාධක ඇසුරින් විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ඓතිහාසික තොරතුරු ඇතුළත් ග්‍රන්ථ, හා අදාළ ප්‍රශ්න

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : මහාවංසය, චූලවංසය හා විදේශිකයන්ගේ වාර්තාවල නර්තන කලාව පිළිබඳ ඇති තොරතුරු ගොනු කරගන්න.

**පියවර 1 :**

- 8, 9 ශ්‍රේණිවල දී ඉගෙන ගන්නා ලද නර්තන කලාවේ ඓතිහාසික පසුබිම පිළිබඳ පෙර දැනුම විමසීම (රූ කම්, සෙල්ලිපි, සන්දේශ කාව්‍ය)

**පියවර 2 :**

- නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලැබුණු බවට තොරතුරු මහාවංසය හා චූලවංසය සාධක ඇසුරින් සාකච්ඡා කිරීම.

**පියවර 3 :**

- ඉබන් බතුතා, ස්පිල් බර්ග් හා රොබට් නොක්ස්ගේ වාර්තා අනුව ආගමික හා සාමාජීය අවශ්‍යතා සඳහා නර්තනය යොදාගැනීම පිළිබඳ තොරතුරු සාකච්ඡා කරමින් සටහන් තබාගැනීමට සැලැස්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- නර්තන කලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු අනාවරණය කර ගත හැකි මූලාශ්‍රය තුනක් නම් කරන්න.
- නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලැබුණු බව මහාවංසය හා චූලවංසය සාධක ඇසුරින් විමසන්න.

**නිපුණතාව 5.0** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැකගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 5.2** : ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූවන් අගයමින් තොරතුරු ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 5.2.1** : නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූවන් අගයමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල 5.2.2** :

- නර්තන ශිල්පිනියන් පිළිබඳ ජීවන තොරතුරු රැස්කරයි.
- නර්තනයේ ප්‍රවර්ධනයට දායක වී ඇති ආකාරය විස්තර කරයි.
- ඔවුන්ගේ සේවය ඇගයීම සම්බන්ධ ව අදහස් දක්වයි.
- පරපුරෙන් පරපුරට ඔවුනට දැක්විය යුතු කෘතවේදීත්වය පිළිබඳ ව යෝජනා ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : නිර්දිෂ්ට නර්තන කලා ශිල්පිනියන් පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථ හා ඡායාරූප

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : මෙම ක්‍රියාකාරකම සැලසුම් කිරීමට පෙර අදාළ ශිල්පිනියන් පිළිබඳ තොරතුරු ගොනු කිරීමට යොමු කරවන්න.

**පියවර 1** :

- ප්‍රවීණ නර්තන ශිල්පිනියන් කිහිප දෙනකුගේ ඡායාරූප පෙන්වා ඔවුන් හඳුනාගැනීමට සැලැස්වීම.
  - ආචාර්ය වජිරා චිත්‍රසේන මිය
  - නර්තන ශිල්පිනී මිරැන්ඩා හේමලතා මිය
- අදාළ ශිල්පිනියන් දෙදෙනාගේ ශිල්පීය කුසලතා හා නර්තන කලාවේ ප්‍රවර්ධනයට ඉටු කළ සේවය පිළිබඳ කෙටි සාකච්ඡාවක් මෙහෙයවීම.

**පියවර 2** :

- රැගෙන ආ ග්‍රන්ථවල ඇති විෂය කරුණු කියවා තහවුරු කරගැනීමට අවස්ථාව සැලැස්වීම.
- සිසුන් සපයාගෙන පැමිණි තොරතුරු සමග සසඳා බලා සටහනක් පිළියෙළ කිරීමට සැලැස්වීම.

**පියවර 3** :

- පිළියෙළ කරන ලද තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී සාකච්ජා කර අවශ්‍ය තොරතුරු සටහන් කරගැනීමට සැලැස්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- නර්තන අධ්‍යාපනයේ ප්‍රවර්ධනය සඳහා නර්තන ශිල්පිනී මිරැන්ඩා හේමලතා මහත්මියගේ දායකත්වය අගයන්න.
- ආචාර්ය වජිරා චිත්‍රසේන මහත්මිය මුද්‍රා නාට්‍ය ක්ෂේත්‍රයට කළ දායකත්වය පිළිබඳ විස්තර කරන්න.

**නිපුණතාව 5.0** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැකගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 5.3** : ශ්‍රී ලාංකේය ගැමිනාටක හා සබැඳි පසුබිම අධ්‍යයනය කර සුවිශේෂ ලක්ෂණ ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 5.3.1** : සොකරි ගැමි නාටකය පිළිබඳ තතු විමසා බලමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල 5.3.2** :

- සොකරි දේශීය ගැමි නාටකයක් බව ප්‍රකාශ කරයි.
- සොකරි නාටකය ප්‍රචලිත ප්‍රදේශ හා පැවැත්වීමේ අරමුණු විස්තර කරයි.
- සොකරි කථා ප්‍රවෘත්තිය පවසයි.
- සොකරි ගැමි නාටකයෙහි ගායන වාදන හා රංග වස්ත්‍රාභරණ පිළිබඳ අදහස් දක්වයි.
- සොකරි ගැමි නාට්‍යයෙහි චරිත නිරූපණ පිළිබඳ විචාරාත්මක ව අදහස් ඉදිරිපත් කරයි.
- ගැමිනාටක අභාවයට යා නොදී ආරක්ෂා කරගැනීමට යෝජනා ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : සොකරි ගැමි නාටකය පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථ, තොරතුරු පත්‍රිකා හා පින්තූර, වීඩියෝ පට

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

**පියවර 1** :

- සොකරි නාටකයෙහි ගායනයක් සමග රංගනයක් හෝ නාටකයෙහි කොටස් කිහිපයක් නැරඹීමට, ගායනය කොටසක් ශ්‍රවණය කිරීමට සලස්වා ශිෂ්‍ය සාධන මට්ටම නිරීක්ෂණය කිරීම.

**පියවර 2** :

- සොකරි නාටකය පිළිබඳ තොරතුරු සඳහන් ග්‍රන්ථ හා උපුටා ගන්නා ලද තොරතුරු සඳහන් පත්‍රිකා කණ්ඩායම්වලට බෙදා දීම.
    - සොකරි ප්‍රචලිත ප්‍රදේශ හා සොකරි නාටක කණ්ඩායම්.
    - පැවැත්වීමේ අරමුණු, පවත්වන ස්ථාන
    - සොකරි කථා ප්‍රවෘත්තිය
    - සොකරි නාට්‍යයෙහි චරිත හා ගායනා
    - රංග භාණ්ඩ, රංග වස්ත්‍රාභරණ හා වෙස්ගැන්වීම් යන මාතෘකා කණ්ඩායම් අතර බෙදා දී, තොරතුරු ගොනු කිරීමට යොමු කරවීම.

**පියවර 3** :

- කණ්ඩායම් ක්‍රියාකාරකම්වලින් ගොනු කරන ලද තොරතුරු ඉදිරිපත් කරවීම.
- ඉදිරිපත් කරන ලද තොරතුරු අගයමින් අදාළ විෂය කරුණු තවදුරටත් සැලසුම් කර සටහන් කරගැනීමට සැලැස්වීම.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- දේශීය ගැමි නාටක නම් කරන්න.
- සොකරි නාටකය ප්‍රචලිත ප්‍රදේශ හා පැවැත්වීමේ අරමුණු දක්වන්න.
- සොකරි කථා පුවත කෙටියෙන් විස්තර කරන්න.
- සොකරි කවියක් ගයන්න.
- ගැමි නාටක අභාවයට යා නොදී සංරක්ෂණය කර ගත හැකි යෝජනා ඉදිරිපත් කරන්න.

**තොරතුරු පත්‍රිකාව**

දේශීය ගැමි නාටක - සොකරි, කෝලම්, නාඩගම්, රූකඩ.

සොකරි ප්‍රචලිත ප්‍රදේශ - මාතලේ, කළුන්දෑව, හඟුරන්කෙත, හේවාහැට, බදුල්ල, කොනකලගල, දඹුල්ල, වන්නි ප්‍රදේශ

පැවැත්වීමේ අරමුණු -
සශ්‍රීකත්වය
පූජාර්ථය
සෞභාග්‍යය
ගමට, රටට සෙත් ශාන්තියක් උදා කරගැනීම
වසංගත රෝග හා ස්වාභාවික විපත් ආදියෙන් මිදීම
විනෝදාස්වාදය.

සොකරි කථා පුවත - කාසි දේශයේ සිට පැමිණි ගුරුහාමි, සොකරි පරයා මෙන් ම තඹරාවිට වෙදරාල, කාලි අම්මා, සොත්තානා යන චරිත මුල් කරගෙන ගොඩනැඟී ඇති කථා පුවත.

ප්‍රාදේශීය වෙනස්කම් - මහනුවර ප්‍රදේශයේ (මාතලේ, නුවර, හඟුරන්කෙත....) සොකරි නාටකය රඟ දැක්වීමේ දී ගැටබෙරය ද, වන්නි ප්‍රදේශවල (අනුරාධපුර, පුත්තලම.......) සොකරි නාටකය රඟ දැක්වීමේ දී වාද්‍ය භාණ්ඩ ලෙස උඩැක්කිය ද, ඌව ප්‍රදේශයේ (බදුල්ල, කළුන්දෑව....) සොකරි නාටකය රඟ දැක්වීමේ දී දවුල ද වාද්‍ය භාණ්ඩය ලෙස භාවිත කිරීම ප්‍රාදේශීය අනන්‍යතාවකි.
කථා ප්‍රවෘත්තියෙහි ද ප්‍රාදේශීය වශයෙන් සුළු වෙනස්කම් තිබුණ ද මුඛ්‍ය පරමාර්ථය පොදු ය.

ගායනය - ප්‍රධාන ගායකයකු හා අත් වැල් ගායකයෙක් සහභාගි වේ.
චරිත හඳුන්වා දීමේ කවි,

**සොකරිය**

අඳුන්ගාන්නී නෙත්දෙක ඔමරි කරන් නී
මල් ගවසන්නී කොණ්ඩය ගොතා හෙලන් නී
තෝඩු දමන්නී පවලම් මාල බඳින් නී
සේල අඳින්නී පොටකින් ඔමරි කරන් නී

**පරයා**

ඉතිං කියන්නේ තුන්වැනි වරට නටන් නේ
පරයා එන්නේ වටපිට නිතර බලන් නේ
කටදොඩ වන්නේ ගිය ගිය තැන පෙරලෙන් නේ
කොක් හඬලන්නේ සොකරිය දෙසයි බලන් නේ

| | | |
|---|---|---|
| වාදනය | - | සරල බෙරපද ඇසුරින් ගොඩනැගී ඇත. මැදුම් (මාත්‍රා 3) තනි තිතට අයත් බෙර පද භාවිත වේ. |
| රංග වස්ත්‍රාභරණ | - | එක් එක් චරිත අනුව නියම වූ රංග වස්ත්‍ර භාවිත වෙයි.<br>පරයා, වෙදරාල වැනි චරිත සඳහා වෙස් මුහුණු භාවිත කරයි.<br>අතීතයේ සොකරි චරිතය සඳහා ද වෙස්මුහුණු භාවිත කර ඇත. |
| සැරසිලි | - | මල් යහන ඇතුළු අනෙකුත් සැරසිලි. |
| රංග භූමිය | - | කමත |

**නිපුණතාව 5.0** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැකගැනීම සඳහා ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 5.4** : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ශාන්තිකර්මවල සුවිශේෂ ලක්ෂණ තුලනාත්මක ව දක්වයි.

**ක්‍රියාකාරකම 5.4.1** : කොහොඹා යක් කංකාරිය, දෙවොල් මඩුව හා පහන් මඩුව ශාන්තිකර්ම පිළිබඳ තොරතුරු තුලනාත්මක ව ඉදිරිපත් කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල 5.4.2** :

- කොහොඹා යක් කංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව ශාන්තිකර්ම හා සබැඳි කතා පුවත්වල අන්තර්ගත සමාජ ආකල්ප විස්තර කරයි.
- එම ශාන්තිකර්ම පැවැත්වීමේ අරමුණු දක්වයි.
- එම ශාන්තිකර්මවල අන්තර්ගත ගායන, වාදන, නර්තන, රංග වස්ත්‍රාභරණ, සැරසිලි හා රංග භාණ්ඩවල සුවිශේෂ ලක්ෂණ තුලනාත්මක ව ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : රූප සටහන්, දෘශ්‍යපට, වාද්‍ය භාණ්ඩ, කාර්යය පත්‍රිකාව

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

**පියවර 1** :

- නිර්දේශ කර ඇති ශාන්තිකර්ම තුන පිළිබඳ ව පහත සඳහන් මාතෘකා ඔස්සේ කෙටි සාකච්ඡාවක් මෙහෙය වීම.
  - පුරාවෘත්ත කථා
  - පැවැත්වීමට හේතු
  - පුද ලබන දෙවිවරු හා යකුන්
  - නර්තන, ගායන, වාදන හා චාරිත්‍ර
  - රංග භාණ්ඩ
  - රංග වස්ත්‍රාභරණ
  - ප්‍රධාන සැරසිලි

**පියවර 2** :

- කාර්ය පත්‍රිකාව ප්‍රදර්ශනය කර සිසුන් ක්‍රියාකාරකමෙහි යොමු කරවීම.
- සම්පූර්ණ කරන ලද කාර්ය පත්‍රිකාව ඇසුරින් ශාන්තිකර්ම පිළිබඳ තොරතුරු තුලනාත්මක ව ගොනු කිරීමට අවශ්‍ය මග පෙන්වීම හා උපදෙස් ලබා දීම.
- කණ්ඩායම් වශයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී දෘශ්‍යපට, රූපසටහන් භාවිත කර අදාළ කරුණු තුලනාත්මක ව විග්‍රහ කිරීම.

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- කොහොඹා යක් කංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව පැවැත්වීමේ අරමුණු විස්තර කරන්න.
- නර්තන, ගායන, වාදන, රංග භාණ්ඩ හා රංග වස්ත්‍රාභරණ පිළිබඳ තුලනාත්මක ව අදහස් දක්වන්න.
- මෙම කතා පුවත් තුළින් සමාජයට ලබා දෙන යහපත් ආකල්ප විස්තර කරන්න.

කාර්ය පත්‍රිකාව

| | **කොහොඹා යක් කංකාරිය** | **දෙවොල් මඩුව** | **පහන් මඩුව** |
|---|---|---|---|
| පුරාවෘත්ත කථාව (කෙටියෙන්) | | | |
| පැවැත්වීමේ අරමුණු | | | |
| පුද ලබන දෙවිවරු හා යකුන් | | | |
| නර්තන අංග | | | |
| ගායන අංග | | | |
| වාදන අංග | | | |
| රංග භාණ්ඩ | | | |
| රංග වස්ත්‍රාභරණ | | | |
| ප්‍රධාන සැරසිලි | | | |

**නිපුණතාව 6.0** : රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම 6.1** : ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය කලාවේ පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 6.1.1** : ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය (ඉගිනළු) කලාවේ ප්‍රභවයට බලපෑ කරුණු විමසා බලමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල 6.1.2** :

- ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය (ඉගිනළු) යන්න හඳුන්වයි.
- ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය (ඉගිනළුවල) සුවිශේෂ ලක්ෂණ විමසයි.
- ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය (ඉගිනළු) කලාවේ ආරම්භය හා විකාශනය පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.
- ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍යය (ඉගිනළු) ප්‍රාසංගික ව ඉදිරිපත් කිරීමට භාවිත කර ඇති විධි ක්‍රම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය (ඉගිනළු) පිළිබඳ තොරතුරු අන්තර්ගත ග්‍රන්ථ, දෘශ්‍යපට හා ඡායාරූප

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** : 1930 දශකයේ සිට 1960 දක්වා කාලය තුළ ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍ය (ඉගිනළු) කලාවෙහි තොරතුරු සැලකිල්ලට ගන්න.

**පියවර 1** :

- දෘශ්‍යපට, ඡායාරූප හා ලිඛිත සටහන් භාවිත කරමින් මුද්‍රා නාට්‍ය (ඉගිනළු) කලාවේ ආරම්භය හා විකාශනය පිළිබඳ තොරතුරු සාකච්ඡා කිරීම.

**පියවර 2** :

- අදාළ ග්‍රන්ථ ඇසුරු කරගනිමින් කරුණු සටහන් කරගැනීමට යොමු කරවීම.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- 1930 දශකයේ සිට 1960 දක්වා ශ්‍රී ලාංකේය මුද්‍රා නාට්‍යය (ඉගිනළු) කලාවේ ආරම්භය හා පසුබිම විස්තර කරන්න.

**නිපුණතාව 6.0** : රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම 6.2** : සම්භාව්‍ය මුද්‍රා නාට්‍යයක් නරඹා විචාරයට ලක් කරයි.

**ක්‍රියාකාරකම 6.2.1** : කලා කෘතියක රස මිහිර පවසමු. (කරදිය/කුඹී කතාව)

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල 6.2.2** :

- මුද්‍රා නාට්‍යයට පාදක වූ කතා පුවත විස්තර කරයි.
- කතා පුවතින් විද්‍යමාන ජීවන දැක්ම විස්තර කරයි.
- චරිත විකාශය සඳහා නර්තන යොදාගෙන ඇති ආකාරය පිළිබඳ අදහස් දක්වයි.
- කලාත්මක ලක්ෂණ තීව්‍ර කිරීම සඳහා සංගීතය, රංග වස්ත්‍රාභරණ, වේදිකා සැරසිලි, ආලෝකකරණය ආදිය යොදාගෙන ඇති ආකාරය විචාරාත්මක ව ඇගයීමට ලක් කරයි.

**ගුණාත්මක යෙදවුම්** : දෘශ්‍ය පට, පින්තූර

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

**පියවර 1** :

- කරදිය/කුඹී කතාව මුද්‍රා නාට්‍යයෙහි කොටස් කිහිපයක් නැරඹීමට සැලැස්වීම. නරඹන ලද කොටස් ඇසුරින්, මුද්‍රා නාට්‍යයෙහි නිර්මාණකරු, කථා ප්‍රවෘත්තිය හා ඒ තුළින් නිරූපිත අර්ථය, සුවිශේෂ චරිත හා චරිත විකාශනය සඳහා නර්තනය යොදාගැනීම , සංගීතය, රංග වස්ත්‍රාභරණ, වේදිකා සැරසිලි, ආලෝකකරණය, යොදාගැනීම පිළිබඳ සාකච්ඡා කිරීම.

**පියවර 2** :

- තෝරා ගත් මුද්‍රා නාට්‍ය කොටස් කිහිපයක් නැවත නැරඹීමට සලස්වා ඒ පිළිබඳ අධ්‍යයනය කොට තොරතුරු සාකච්ජා කර අවශ්‍ය කරුණු සටහන් කරගැනීමට යොමු කිරීම.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

- කරදිය/කුඹීකතාව මුද්‍රා නාට්‍යයට පසුබිම් වූ කතා පුවත කෙටියෙන් ලියන්න.
- තේමාව විකාශනය සඳහා නර්තන යොදාගෙන ඇති ආකාරය විස්තර කරන්න.
- කරදිය/කුඹී කතාව මුද්‍රා නාට්‍යයෙහි දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.

**නිපුණතාව 6.0** : රසඥතා වර්ධනය සඳහා විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක් කරයි.

**නිපුණතා මට්ටම 6.3** : වෙනත් සංස්කෘතියකට අයත් නර්තන සම්ප්‍රදාය අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 6.3.1** : කථකලි නර්තනයෙහි තතු විමසමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

ඉගෙනුම් පල 6.3.2 :

- කථකලි යන්න අර්ථ දක්වයි.
- කථකලි ප්‍රචලිත ප්‍රදේශ හා ඒ හා බැඳි සුවිශේෂ ආයතන නම් කරයි.
- කථකලි සංගීත සම්ප්‍රදාය හා වාද්‍ය භාණ්ඩ නම් කරයි.
- මෙම නර්තන සම්ප්‍රදාය ආහාර්ය අභිනයෙන් පොහොසත් බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** : දෘශ්‍යපට, ඡායාරූප, තොරතුරු පත්‍රිකාව, ඇගයීම් ප්‍රශ්නාවලිය, කාර්ය පත්‍රිකා අංක 01

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

**පියවර 1 :**

- 8, 9 ශ්‍රේණිවල උගත් ඉන්දීය නර්තන සම්ප්‍රදායන්, ප්‍රචලිත ප්‍රදේශ පිළිබඳ පෙර දැනුම විමසීම.
- කථකලි නර්තන අංග සහිත වීඩියෝ පටයක් නැරඹීමට සැලැස්වීම හෝ කථකලී නර්තන අවස්ථා සහිත ඡායාරූප මගින් මෙම නර්තන සම්ප්‍රදාය හඳුනාගැනීමට සලස්වා :
- කථකලි වචනාර්ථය
- සංගීත සම්ප්‍රදාය හා වාද්‍ය භාණ්ඩ
- වේශ නිරූපණය
- අධ්‍යාපන ආයතන
- ආහාර්‍ය අභිනයෙන් පොහොසත් බව පිළිබඳ සාකච්ඡා කිරීම.

**පියවර 2 :**

- තොරතුරු පත්‍රිකාව ලබා දී ඒ පිළිබඳ අධ්‍යනය කිරීමට යොමු කරවීම හා සාකච්ඡා කිරීම

**පියවර 3**

- ඇගයීම් ප්‍රශ්නාවලිය ලබා දී ඊට පිළිතුරු සැපයීමට අවස්ථාව ලබා දීම

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

සාකච්ඡා කරන ලද කරුණු හා දෙන ලද තොරතුරු පත්‍රිකාව ඇසුරින් ඊට අදාළ ඇගයීම් ප්‍රශ්නාවලියට ලබා දී ඇති පිළිතුරු ඇගයීමට ලක් කරන්න.

**ඇගයීම් ප්‍රශ්නාවලිය**

සුදුසු වචන යොදා හිස් තැන් පුරවන්න.

- කථකලි නර්තන සම්ප්‍රදාය දක්ෂිණ භාරතයේ ...................................... ප්‍රාන්තයේ ප්‍රභවය වූවකි.
- කථකලි සඳහා අධ්‍යාපන ආයතනයක් බිහි වූයේ ........................... වර්ෂයේ දී ය. එය ............................ කලා මණ්ඩලම් නම් විය.
- දක්ෂිණ භාරතීය .................................... සංගීත සම්ප්‍රදාය මත ගොඩනැගුණු කථකලිහි ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ....................................... යි.
- මෙහි ප්‍රධාන ගායකයා ................................................ නම් වන අතර අනු ගායකයා .......................................... නම් වෙයි.

**තොරතුරු පත්‍රිකාව**

කථකලි යනු කථා ප්‍රවෘත්තියක් අභිනයෙන් හා නෘත්‍ය ලීලාවන්ගෙන් ඉදිරිපත් කරනු ලබන දෘශ්‍ය කාව්‍යයකි. කථකලි නර්තනයෙහි නිජබිම දක්ෂිණ භාරතයෙහි කේරළ ප්‍රාන්තය යි. දේව විශ්වාස පදනම් වු මෙම නර්තන සම්ප්‍රදාය ආගමික පුද පූජා, ගැමි නැටුම් හා ගැමි නාටක ආශ්‍රයෙන් බිහි වූවකි.

මහාකවි වල්ලතෝල් නාරායන් මෙනන් විසින් කථකලි නර්තන සම්ප්‍රදාය නිර්මාණය කරන ලද්දේ කේරළයේ දේව මන්දිරයන්හි උරුමක්කාරයන් වු චක්කියර්වරුන් ග්‍රාම දේව පූජාවල දී ඉදිරිපත් කරන ලද චක්කියර් කූත්තු හා කුඩි ආට්ටම් වැනි ගැමි නැටුම් හා 16 වැනි සියවසේ කේරළයේ විසූ කොට්ටාරක්කරයේ තාම්පුරම් ප්‍රාදේශීය රජු නිර්මාණය කළ "රාමනාට්ටම්" හා කැලිකට්හි සැමොරින් රජු නිර්මාණය කළ ක්‍රිෂ්ණාට්ටම් වැනි ආගමික ගැමි නාටකයන්හි ආභාසය ලබමිනි. 1930 දී කථකලි නර්තනය ප්‍රචලිත කිරීම සඳහා "කේරළ කලා මණ්ඩලම්" යනුවෙන් කථකලි උගන්වන ආයතනයක් ද පිහිටු වන ලදී.

දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතය ආභාසයෙන් මෙහි සංගීතය සකස් වී ඇත. චෙන්ඩාව සහ මද්දලය ප්‍රධාන වාද්‍ය භාණ්ඩ වේ. පංචවාද්‍යම් (එඩැක්ක, ඉලතාලම්, චෙංගිලම් හා කුම්බු නම් සුසිර) වාද්‍ය භාණ්ඩ වාදනය සඳහා යොදා ගැනේ. ගායන නොමැති ව කථකලි රඟ දැක්විය නොහැකි ය. මෙහි ගායකයෝ දෙදෙනෙකි. ප්‍රධාන ගායකයා "පොන්නානි" වන අතර අනු ගායකයා "ශිංකිඩිය" (සිංකිඩි)

කථකලි ආහාර්ය අභිනයෙන් පොහොසත් නර්තන සම්ප්‍රදායකි. චරිතවලට අනුව ඉතා විචිත්‍රවත් අයුරින් සැකසුණු රංග වස්ත්‍රාභරණ භාවිත වන අතර ඊට ම ගැළපෙන සංකීර්ණ වේෂ නිරූපණ භාවිත වෙයි. ඒවා මිනික්කු පච්චා, කත්තී, තාඩී, කාරී, ධෙප්පු වශයෙන් වෙන් වෙන් ව ඇත. හිස් පළඳනා වශයෙන් ක්‍රීටම් (ඔටුණු) වර්ග තුනක් ද භාවිත කෙරේ.

කථකලි නර්තන ශිල්පීහු සංවාදයෙහි හෝ ගායනයෙහි නොයෙදෙති. භගවද්ගීතාව, රාමායණය වැනි කාව්‍ය ග්‍රන්ථවල එන කථා ප්‍රවෘත්ති පසුබිම් ගායනයෙන් ඉදිරිපත් කරන අතර නර්තන ශිල්පීහු හස්ත මුද්‍රා හා අභිනය යොදාගෙන ගායනයෙහි අදහස නැටුමෙන් නිරූපණය කරති. කථකලි නළුවකුට සුබනම්‍ය සිරුරක් හා අවයව මැනවින් හසුරුවා ගැනීමේ ශක්තියක් ද, රස නිෂ්පත්තියට උචිත වු මුහුණින් හැඟීම් ප්‍රකාශ කිරීමේ හැකියාව හා අභිනය පෑමේ නිපුණත්වයක් ද තිබිය යුතු ය.

**නිපුණතාව 7.0** : අත්දැකීම් ඇසුරු කරගනිමින් විවිධ කලාංග නිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම 7.1** : නාට්‍ය ගීතයකට නර්තන නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 7.1.1** : වේදිකා නාට්‍ය ගීයට නර්තන නිර්මාණය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල 7.1.2** :
- තෝරාගත් ගීතය පිළිබඳ සාකච්ඡා කරයි.
- නිවැරදි නාද රටාව අනුව ගීතය ගායනය කරයි.
- ගීතයට උචිත චලන යොදා ගනිමින් නර්තන නිර්මාණය කරයි.
- නිර්මාණය සාර්ථක කරගැනීමට කණ්ඩායමේ සෑම සාමාජිකයෙක් ම උපරි ම දායකත්වය ලබා දෙයි.
- සාමූහිකත්වය අගයමින්, අන් අයගේ අදහස්වලට ගරු කරයි.
- ප්‍රාසංගික නර්තන අංගයක් නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ශ්‍රව්‍ය පට, බෙර, තාලම්පට ඇමුණුම

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

**පියවර 1** :
- අදාළ නාට්‍ය ගීත දෙක ශ්‍රවණය කිරීමට සැලැස්වීම හා ඒ පිළිබඳ සාකච්ඡා කිරීම.

**පියවර 2** :
- නර්තන නිර්මාණය කිරීමට කැමති ගීතයක් තෝරා ගැනීම.
- තෝරා ගත් ගීතය ශ්‍රවණය කිරීම හා ගායනය.
- ගීතයට උචිත ලෙස නර්තන නිර්මාණය කිරීමට මග පෙන්වීම.

**පියවර 3** :
- එක් එක් කණ්ඩායම් කරන ලද නිර්මාණය ඉදිරිපත් කිරීමට සූදානම් කරවීම.
- ඉදිරිපත් කරන ලද නර්තන නිර්මාණ පිළිබඳ අදහස් දැක්වීමට අවස්ථාව සැලසීම හා ඒවා අගය කරමින් සාකච්ඡා කිරීම.

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :
- තෝරාගත් ගීතය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්න.
- ගීතයට අනුව කරන ලද නර්තන නිර්මාණ ඉදිරිපත් කරන්න.

**ඇමුණුම**

හනික වරෙව් කොල්ලනේ මෙන්න මෙහෙ වරෙව් .......... //
මෙන්න මෙහෙ වරෙව් කොල්ලනේ නට නටා වරෙව් .......... //
තොපිට හරිම වාසියක් නටනටා වරෙව් .......... //

වැඩේ අමාරුත් නැති තෑගි ටිකත් අපි අතේ .......... //
රත්තරනින් ගෙවන්නේ හිරු දෙවියොයි කියන්නේ .......... //
මෙන්න මෙහෙ වරෙව් කොල්ලනේ නටනටා වරෙව් .......... //

තොපිට හරිම වාසියක් නට නටා වරෙව් .......... //

හනික වරෙව් කොල්ලනේ මෙන්න මෙහෙ වරෙව් .......... //

සාදු සාදු කියල්ලා - ප්‍රීති ඝෝෂා කරල්ලා .......... //
හිරු දෙවිඳුගෙ ගොපල්ලෝ කන්ද උඩින් වරෙල්ලා .......... //
හිරු දෙවිඳුගෙ හරක් ගත්තු හරක් හොරා හොයල්ලා .......... //
ලෝකෙ වටේ ගොහිල්ලා හරක් හොරා හොයල්ලා .......... //
හිරු දෙවිඳුගෙ හරක් ගත්තු හරක් හොරා හොයල්ලා .......... //

වනන්තරේ හොයාපියෝ - ගල් අරඹේ හොයාපියෝ
වන කතරේ හොයාපියේ - මිනිස් වාසේ හොයාපියෝ
කඳු මුදුනේ, ගං ඉවුරේ, වනන්තරේ හොයාපියෝ
හිරු දෙවිඳුගෙ ගොපල්ලෝ අපි, අපිට දෙවියො බලාපියෝ .......... //
රං අභරණ පැලඳගත්තු මහපොළොවේ රන් වපුරන
හිරු දෙවියෝ බලාපියෝ .......... //
හරක් හොරා සොයාගන්න සියලු දෙවියෝ පිහිට වියෝ ..........

ඕ .. ඕ .. ඕ .. ................

- ග්‍රීක නාටකයක් ඇසුරින් බන්දුල ජයවර්ධන ශූරීන් නිර්මාණය කළ බෙර හඬ අනුවර්තන නාට්‍යයේ ජැක්සන් ඇන්තනී ප්‍රමුඛ කණ්ඩායම මෙම ගීතය ගායනය කරමින් රඟති.

මෙම ගිම්හාන ග්‍රීස්ම වූ කාලේ
අපේ උද්‍යානේ ක්‍රීඩා සැපා දේ
යස රම්‍යා වූ සැන්දෑවකී මේ
අපේ උද්‍යානේ ක්‍රීඩා සැපා දේ

සූර්යයා යයි බැසී - චන්ද්‍රයා එයි නැඟී
බිඟු රාශී මදු ලෝලෙන් හැසිරෙන්නා //
කෝකිලා දී පක්ෂි ගීත රැව්දේ නැගේ
අපේ උද්‍යානේ ක්‍රීඩා සැපා දේ

- රචක : නීතිඥ චාර්ල්ස් ඩයස් (විදුර නාට්‍ය තූර්තිය)

**නිපුණතාව 7.0** : අත්දැකීම් ඇසුරු කරගනිමින් විවිධ කලාංග නිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම 7.2** : චරිත ස්වභාවය ප්‍රදර්ශනය වන පරිදි අංග රචනය කරයි.

**ක්‍රියාකාරකම 7.2.1** : වේදිකා නර්තනයකට උචිත අංග රචනයක් ගොඩ නගමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල 7.2.2** :

- සරල අංග රචනය යනු කුමක්දැයි විස්තර කරයි.
- අංග රචනයේ අවශ්‍යතාව පිළිබඳ අදහස් දක්වයි.
- අංග රචනා ආලේපන තෝරයි.
- අංග රචනා ශිල්පක්‍රම හඳුනාගනිමින් වේදිකා නර්තනයක් සඳහා අංග රචනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : අංග රචනා කට්ටල, ඡායාරූප, වීඩියෝපට

**ක්‍රියාකාරකම සැලසුම් සඳහා උපදෙස් :**

**පියවර 1 :**

- අංග රචනා ප්‍රදර්ශනය වන ඡායාරූප, වීඩියෝපට ප්‍රදර්ශනය කිරීම.
- සරල අංග රචන පිළිබඳ සිසු අදහස් විමසීම.
- අංග රචනා ආලේපන ද්‍රව්‍ය හඳුනාගැනීමට සැලැස්වීම.
- අංග රචනා කිරීමට සුදුසු පරිසරයක් හා අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගැනීම. (නිවැරදි ආලෝක තත්ත්වය, පිරිසිදු වාතාශ්‍රය හා සිසිල් බව, දර්පණයක්, ජලය, ආලේපන ද්‍රව්‍ය හා උපකරණ)

**පියවර 2 :**

- පන්තියේ සිටින සිසුන් සංඛ්‍යාව අනුව කුඩා කණ්ඩායම්වලට බෙදීම.
- සරල අංග රචනාවට උදාහරණ සැපයීම.
- අංග රචනා ද්‍රව්‍ය භාවිත කරමින් වේදිකා නර්තනයක් සඳහා සුදුසු සරල අංග රචනා ගොඩනැගීමට යොමු කරවීම.

**පියවර 3 :**

- සිසු අංග රචන නිර්මාණ ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබාදීම.
- සෙසු නිර්මාණ නිරීක්ෂණයට ලක් කිරීමට අවස්ථාව ලබාදීම.
- නිර්මාණ පිළිබඳ අදහස් හා යෝජනා විමසමින් සිසු ක්‍රියාකාරකම් අගයමින් අංග රචනය සංවර්ධනය කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

අවශ්‍ය උත්සව අවස්ථාවල දී ද සිසුන්ට අංග රචනය කිරීමට අවස්ථාව ලබා දී අගයන්න.

- සරල අංග රචනාවක් සිදු කරන නිවැරදි පියවර සඳහන් කරන්න.
- සරල අංග රචනාවක අවශ්‍යතාව පිළිබඳ වාක්‍ය තුනක් ලියන්න.
- අංග රචනය කිරීමෙන් නළුවාට ඇති ප්‍රයෝජන දෙකක් ලියන්න.

**නිපුණතාව 7.0** : අත්දැකීම් ඇසුරු කරගනිමින් විවිධ කලාංග නිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම 7.2** : චරිත ස්වභාවය ප්‍රදර්ශනය වන පරිදි අංග රචනය කරයි.

**ක්‍රියාකාරකම 7.2.2** : සත්ත්ව චරිත සඳහා සරල අංග රචනයක් කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල 7.2.3** :

- සත්ත්ව අංග රචනයක් යනු, කුමක්දැයි විස්තර කරයි.
- නිර්මාණ කාර්යයේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත් විස්තර කරයි.
- ත්‍රිමාන ලක්ෂණ මතු කිරීමට වර්ණ ගැලපීම කළ යුතු බව පිළිගනියි.
- විවිධ ක්‍රමවේදයන් මගින්, සත්ත්ව අංග රචනා නිර්මාණය කළ හැකි බව ප්‍රකාශ කරයි.
- සෙසු අයගේ නිර්මාණ අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : අංග රචන උපකරණ හා ද්‍රව්‍ය, ඡායාරූප, වීඩියෝපට

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

**පියවර 1** :

- අංග රචනා ප්‍රදර්ශනය වන ඡායාරූප සහ වීඩියෝ පට ප්‍රදර්ශනය කිරීම.
- සත්ත්ව චරිතවලට අංග රචනය කිරීම පිළිබඳ සිසු අදහස් විමසීම.
- සත්ත්ව චරිතවලට අංග රචනය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ සාකච්ඡා කිරීම.
- සත්ත්ව චරිත අංග රචනය ක්‍රම ශිල්ප හා ඒ සඳහා අවශ්‍ය ආලේපන ද්‍රව්‍ය හඳුන්වා දීම.

**පියවර 2** :

- සත්ත්ව චරිත සඳහා අංග රචනයට උදාහරණ සපයමින් කණ්ඩායම්වලට සුදුසු මාතෘකා ලබා දීම.
- දළ සටහන් ඇඳීමට මග පෙන්වීම. දළ සටහනට අනුරූපී ලෙස චරිත සහ හැඩතල භාවිතයෙන් අංග රචන නිර්මාණය කිරීමට යොමු කරවීම.

**පියවර 3** :

- කණ්ඩායම් වශයෙන් සිසු නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම
- අනෙකුත් නිර්මාණ නිරීක්ෂණයට ලක් කිරීමට අවස්ථාව ලබාදීම.
- මිනිස් හා සත්ත්ව චරිත අංග රචනවල වෙනස්කම් පිළිබඳ විමසීම.
- සිසු ක්‍රියාකාරකම් අගයමින් සාකච්ඡා කර ත්‍රිමාන ලක්ෂණ මතු කිරීමට වර්ණ භාවිත කරන ආකාරය විස්තර කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

සත්ත්ව අංග රචනාවක් නිර්මාණය කිරීම සඳහා අධ්‍යයනය කළ යුතු මූලික කරුණු සඳහන් කරන්න.

- සත්ත්ව චරිත අංග රචනා සඳහා භාවිත කරන ආලේපන ද්‍රව්‍ය 02ක් නම් කරන්න
- ත්‍රිමාන බව මතු කිරීම සඳහා වර්ණ භාවිත කළ යුතු ස්වභාවය පිළිබඳ වාක්‍ය 02 ක් ලියන්න.

**නිපුණතාව 7.0** : අත්දැකීම් ඇසුරු කරගනිමින් විවිධ කලාංග නිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම 7.3** : දේශිය නර්තන සම්ප්‍රදාය හා සබැඳි රංග වස්ත්‍රාභරණ ආකෘතියක් නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම 7.3.1** : සාම්ප්‍රදායික රංග වස්ත්‍රාභරණ කට්ටලයක ආකෘතියක් හදමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල 7.3.2** :

- දේශීය නර්තන සම්ප්‍රදායවල රංග වස්ත්‍රාභරණ පිළිබඳ ව හඳුන්වයි.
- ඒ ඒ ඇඳුම් කට්ටල සඳහා භාවිත අමුද්‍රව්‍ය හා වර්ණ පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.
- මනා නිමාවකින් යුතු රංග වස්ත්‍රාභරණ ආකෘතියක් නිර්මාණය කරයි.
- නිර්මාණය කරන ලද රංග වස්ත්‍රාභරණ ආකෘති පිළිබඳ විචාරය කරමින් අදහස් ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙවුම් 7.3.2** : සාම්ප්‍රදායික ඇඳුම් කට්ටලයක්/ සාම්ප්‍රදායික ඇඳුම් කට්ටලවල ඡායාරූප

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :** මෙම පාඩම සඳහා පෙර සූදානම අත්‍යවශ්‍ය වේ.

**පියවර 1**

- සිසුන් රැස් කරගත් සාම්ප්‍රදායික ඇඳුම් කට්ටල ඇතුළත් ඡායාරූප සම්ප්‍රදායන් තුනට අයත් වන සේ වර්ග කිරීමට යොමු කරවීම.
- සම්ප්‍රදායන් අනුව වෙන් කරගත් ඡායාරූප ඇසුරින් ඇඳුම් කට්ටල හඳුනාගැනීමට මග පෙන්වීම.
- සාම්ප්‍රදායික ඇඳුම් කට්ටලවල භාවිත වර්ණ, හැඩතල, අමුද්‍රව්‍ය පිළිබඳ විස්තර කර පන්ති කාමරය තුළ රංග වස්ත්‍රාභරණ කට්ටලයක් සකස් කිරීමේ දී අමුද්‍රව්‍ය තෝරා ගත යුතු ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම.

**පියවර 2**

- නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන රංග වස්ත්‍රාභරණ කට්ටල සඳහා දළ සටහනක් නිර්මාණය කිරීම
- දළ සටහන සකස් කිරීමේ දී නියමිත මිමි ප්‍රමාණය හා සාම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂා කරගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.
- රංග වස්ත්‍රාභරණ කට්ටල ආකෘති නිර්මාණයට යොමු කිරීම.

**පියවර 3**

- නිර්මාණය කරන ලද රංග වස්ත්‍රාභරණ ආකෘති ප්‍රදර්ශනය කිරීම.
- නිර්මාණ පිළිබඳ අන්‍ය අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී නිර්මාණයන් අගයමින් ඒවා සංවර්ධනය කරගත හැකි ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- රංග වස්ත්‍ර ආකෘතියේ දළ සැලැස්මක් අඳින්න.
- ප්‍රදර්ශනයක් සඳහා රංග වස්ත්‍රාභරණ ආකෘතියක් නිර්මාණය කරන්න.
- සෙසු නිර්මාණ අගයමින් අදහස් ඉදිරිපත් කරන්න.

**නිපුණතාව 8.0** : නර්තන කලාවෙන් ලැබෙන මානසික හා ශාරීරික ස්වස්ථතාව සාර්ථක දිවි පෙවෙතක් ගත කිරීමට ඉවහල් කර ගනියි.

**නිපුණතා මට්ටම 8.1** : මානසික ස්වස්ථතාව පවත්වා ගැනීමේ වැදගත්කම විස්තර කරයි.

**ක්‍රියාකාරකම 8.1.1** : 'නර්තනයෙන් මනස සුවපත් කර ගනිමු'

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පළ 8.1.2** :
- මානසික ස්වස්ථතාව පවත්වා ගැනීමේ විධික්‍රම ඉදිරිපත් කරයි.
- මානසික ස්වස්ථතාව පවත්වා ගැනීමේ වැදගත්කම පිළිබඳ අදහස් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : ඇමුණුම 1

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස්** :

**පියවර 1** :
- ප්‍රාසංගික නර්තන වැඩසටහනක් නැරඹීමට සිසුනට අවස්ථාව සැලසීම හෝ විවිධ ප්‍රසංගයක් නරඹමින් සිටි හෝ එහි ක්‍රියාකාරී වී සිටි මොහොතක හැඟීම් පිළිබඳ ව මතකයට නැංවීම.
- නර්තනයට යෝග්‍ය මානසික සූදානම මෙන් ම නර්තනයේ යෙදීමෙන් ලබන මානසික සුවතාව පිළිබඳ විමසීම. (කලා කෘතියක් නැරඹීමේ දී ප්‍රේක්ෂකයකු ලෙස අපට දැනෙන මානසික තෘප්තිය, ශිල්පියකු ලෙස ශක්‍යතා ප්‍රදර්ශනය කරන විට ලැබෙන කායික හා මානසික සුවතාව) ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබෙන විට ශිල්පියකුට ලැබෙන මානසික තෘප්තිය වෙනත් කිසිවකුටත් නොලැබෙන බව සාකච්ඡා කිරීම.

**පියවර 2** :
- මානසික සුවතාව හා නර්තන ඉගෙනුම් ක්‍රියාකාරකම් අතර ඇති සමීප සම්බන්ධතාව විමසීම.

**පියවර 3** :
- සම්භාව්‍ය කලාකෘතීන් නරඹා රස විඳීමෙන් මනා ආකල්ප, නිර්මාණාත්මක හා විචාරාත්මක චින්තනය වර්ධනය වන බව සාකච්ඡා කිරීම.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :
- මානසික ස්වස්ථතාව පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- මානසික ස්වස්ථතාව වැඩි දියුණු කිරීමට නර්තනය ඉගෙනීම බලපාන්නේ කෙසේ දැයි සරල වාක්‍ය දෙකකින් විස්තර කරන්න.

**විෂය අන්තර්ගතය :**

ස්වස්ථතාව යන්න ශාරීරික තත්ත්ව ඉක්මවා ගොස් මානසික, සාමාජීය හා ආධ්‍යාත්මික පැතිකඩ ද ඇතුළත් වන සංසිද්ධියකි. ළමයකුගේ චින්තනය, ක්‍රියාව, චිත්තවේගීය ප්‍රකාශන හා චර්යා රටා නිරීක්ෂණය කරමින් ලබාගන්නා තොරතුරු අනුව ඔහුගේ මානසික ස්වස්ථතාව පිළිබඳ නිගමනවලට එළඹිය හැකි ය.

මානසික වශයෙන් නීරෝගී ළමයින් තම වයසට අනුකූල චර්යා ප්‍රතිචාර දක්වති. යමකුට තම දෛනික කටයුතු මනා ව හසුරුවාගෙන සාමාන්‍ය ජීවිතයක් ගත කළ හැකි නම්, ඔහු මානසික ස්වස්ථතාවෙන් යුක්ත වේ. ඒ අනුව ළමයකුගේ මානසික ස්වස්ථතාව පිළිබඳ නිගමනය කළ හැකි ය. (මට්ටම් හඳුනාගත හැකි ආකාර වේ.)

01. ළමයින් හැසිරෙන ආකාරය අනුව
02. සමාජය අනුව හැඩගැසීමේ හැකියාව
03. ජීවිතයේ විවිධ අවස්ථාවල දී ළමයින් යෝග්‍ය ලෙස ප්‍රතිචාර දක්වන ආකාරය
04. තම සමවයස් සගයන්ට භූමිකා ආදර්ශ සැපයීම
05. වයසට සරිලන පෞරුෂ වර්ධනයකින් යුක්ත වීම
06. විවෘත බව, විශ්වාසවන්ත බව හා ආත්ම විශ්වාසයෙන් යුතු ව ක්‍රියා කිරීම
07. තමන් පිළිබඳ ධනාත්මක ස්වාභිමානයෙන් යුතු ව ක්‍රියා කිරීම
08. අලුත් තොරතුරු දැනගැනීමේ ඇති උනන්දුව
09. තම ගැටලු හා ගැටුම් මනා ලෙස හසුරුවා ගැනීම.

ළමුන්ගේ මානසික ස්වස්ථතාවල වෙනස්කම් සිදු වන්නේ සංකීර්ණ ලෙස ළමයාගේ වර්ධන අවධි කෙරෙහි බලපාන විවිධ සාධක හේතුවෙනි. මෙම සාධක කොටස් දෙකකට වෙන් කළ හැකි ය.

01. ජානමය සාධක හෙවත් ආරමය සාධක
02. පාරිසරික සාධක

ජානමය සාධක යනු, ළමයින් තම දෙමව්පියන්ගෙන් උරුම කරගත් ගුණාංග වේ. එසේ ම ළමුන්ගේ මානසික ස්වස්ථතාව කෙරෙහි බලපාන පරිසර සාධක කොටස් දෙකකි.

01. ජීව විද්‍යාත්මක පාරිසරික සාධක
02. භෞතික පාරිසරික සාධක

මානසික හා කායික සංවර්ධනය සඳහා අවස්ථාව සපයා දීම මගින් මානසික සුවතාව නිරායාසයෙන් වැඩි දියුණු වේ. ඒ අනුව අන්‍යයන්ගේ උපකාරක මැදිහත් වීම අවශ්‍ය ළමයින්, ඔවුන්ගේ චර්යා රටා මගින් හඳුනාගත හැකි ය. තව ද එකී ළමුන් දක්වන විවිධ හැසිරීම් සඳහා හේතු හඳුනාගෙන නිවැරදි මගට යොමු කිරීමට ද සමත් විය යුතු ය.

**නිපුණතාව 8.0** : නර්තන කලාවෙන් ලැබෙන මානසික හා ශාරීරික ස්වස්ථතාව සාර්ථක දිවි පෙවෙතක් ගත කිරීමට ඉවහල් කර ගනියි.

**නිපුණතා මට්ටම 8.2** : මානසික ස්වස්ථතාව පවත්වා ගැනීමට නර්තන ක්‍රියාකාරකම් ඉවහල් වන අයුරු විමසයි.

**ක්‍රියාකාරකම 8.2.1** : 'නිසිසේ නටමු. සුවසේ වෙසෙමු.'

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල 8.2.2** :

- නර්තන ක්‍රියාකාරකම් මගින් ලබාගත් අත්දැකීම් විස්තර කරයි.
- මානසික ස්වස්ථතාව හා නර්තන ක්‍රියාකාරකම් අතර ඇති සම්බන්ධතාව විස්තර කරයි.
- නර්තන කලාව හැදෑරීමෙන් ලැබෙන ශක්‍යතාවන් පිළිබඳ අවබෝධයෙන් යුතු ව නර්තනයේ යෙදේ.
- නර්තන කලාව හැදෑරීමේ අවශ්‍යතා අගයමින් අදහස් දක්වයි.
- නර්තන කලාව හැදෑරීමෙන් ලැබෙන ශක්‍යතා සාර්ථක දිවි පෙවෙතක් ගත කිරීමට ඉවහල් වන බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** : කාර්ය පත්‍රිකාව 1, පින්තූර, VCD

**ක්‍රියාකාරකම සැලසුම සඳහා උපදෙස් :**

**පියවර 1** :

- නර්තනයක යෙදී සිටින දර්ශනයක්, පින්තූරයක් ප්‍රදර්ශනය කර, නර්තන ක්‍රියාකාරකම් මානසික ස්වස්ථතාව වර්ධනයට හේතු වන බව කෙටි -යෙන් සාකච්ඡා කිරීම.
- කාර්ය පත්‍රිකාව 1 කණ්ඩායම් අතර බෙදා දීම.
- අවශ්‍ය උපදෙස් ලබාදෙමින් කණ්ඩායම් ක්‍රියාකාරකමෙහි යෙදවීම.

**පියවර 2** :

- කණ්ඩායම්වලට පිළිතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.
- සියලු ම කණ්ඩායම් පිළිතුරු ඉදිරිපත් කළ පසු ලබාදුන් පිළිතුරු අගය කිරීම.
- අවශ්‍ය කරුණු සටහන් කර ගැනීමට සැලැස්වීම.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නර්තන කලාව හැදෑරීමේ වැදගත්කම පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.
- ගීතයක් අනුව නර්තන නිර්මාණ සමූහ ක්‍රියාකාරකමින් වර්ධනය කර ගත හැකි කුසලතා තුනක් ලියන්න.
- සාර්ථක දිවි පෙවෙතක් ගත කිරීමට නර්තන ක්‍රියාකාරකම් තුළින් ලබාගත හැකි අත්දැකීම් දෙකක් ලියන්න.


**කාර්ය පත්‍රිකාව 1**

I ඔබ වඩාත් ප්‍රිය කරන නර්තන ක්‍රියාකාරකම නම් කරන්න.
නර්තනයේ දී අංග, ප්‍රත්‍යංග හා උපාංග අතර සම්බන්ධතාව පවත්වා ගැනීමේ වැදගත්කම විස්තර කරන්න.

II නර්තන නිර්මාණයක් කිරීමේ දී ලැබෙන අත්දැකීම් පෙළ ගස්වන්න.
සමබර සහ යහපත් මානසික සිතුවිලි ඇති කරගැනීමට බලපෑ නර්තන නිර්මාණ ක්‍රියාකරකම් මොනවාදැයි ලියන්න.

III නර්තන කලාව හැදෑරීමෙන් අත්පත් කරගත හැකි ශාරීරික කුසලතා පිළිබඳ අගයමින් කෙටි සටහනක් ලියන්න.

**විෂය අන්තර්ගතය**




ඉහත සඳහන් මානසික සුවතාව පවත්වා ගැනීමේ විධික්‍රම කීපයකි. සෞන්දර්යාත්මක පරිසර සාධක අත් විඳින ළමයකු වෙත ඒවා පහසුවෙන් ළඟා කර ගත හැක.

01. නර්තනයේ යෙදීම
02. විවිධ ගායන, වාදන කථා පුවත්වලට සවන් දීම
03. ප්‍රාසංගික අංග නැරඹීම
04. වර්ණවත් විසිතුරු රංග වස්ත්‍රාභරණ භාවිතය
05. රංග සැරසිලි හා රංග භාණ්ඩ සැකසීම
06. විවිධ තේමාවන් අනුව රංගනය හා භූමිකා නිරූපණය

මෙසේ විශේෂයෙන් නර්තන විෂය හදාරන ළමයකු වෙත ඉහත කී මානසික ස්වස්ථතාව පවත්වා ගැනීම වැදගත් ආකාර කිහිපයකි.

01. නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා ඉදිරිපත් වීම.
02. කලා කෘති ඇගයීමට ලක් කිරීම.
03. ප්‍රාසංගික කලා අංගයන් පිළිබඳ ව නිවැරදි ඇගයීමක් කිරීම.
04. ඉගෙනුම් ක්‍රියාවලිය තුළ සක්‍රිය දායකත්වය ප්‍රදර්ශනය කිරීම.

ළමයාගේ මානසික පරිණතිය පරිසරය, දෛනික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් අනුව වෙනස් වෙයි. මානසික ස්වස්ථතාව පවත්වාගෙන යෑම සඳහා නර්තන ක්‍රියාකාරකම් යොදා ගත හැකි ය. ළමයි නිසගයෙන් ම ප්‍රායෝගික ක්‍රියාකාරකම් කිරීමට කැමැත්තෝ ය. යම් ළමයකු එසේ නොවන විට ඔහු යම් මානසික ව්‍යාකුලතාවකින් සිටින බව පැහැදිලි වේ. නර්තන ක්‍රියාකාරකම්හි යෙදීමේ දී සිසුන් ඍජු ව හෝ වක්‍ර ව තම මානසික තත්ත්වයන් ප්‍රකාශ කරයි.

නර්තන ක්‍රියාකාරකම් මගින් ළමයා තුළ පවතින පීඩිත චිත්තවේග හා ශක්තීන් ශාරීරික ව මුදා හැරීම සිදු වෙයි. එම නිසා නර්තනය සිරුර හා සම්බන්ධ ක්‍රියාවලියක් වන අතර, එකී ක්‍රියාකාරකම් මානසික තත්ත්වයන් පවත්වා ගැනීමෙහි ලා ඉවහල් වන බව පැහැදිලි වෙයි.

- නර්තනය හා බැඳි ක්‍රියාකාරකම්හි චලනය, වාදනය, ගායනය හා රූපණය මාංස පේශි චලනයේ දී රුධිරනාල පද්ධතිය ක්‍රමවත් වීමෙන් මනස හා සම්බන්ධ ඉන්ද්‍රියන්ට සිදුවන බලපෑම.
  සංචලන හැසිරවීමේ දී මනෝචාලක ක්‍රියාකාරිත්වය වර්ධනය වීම.
  නර්තන ක්‍රියාකාරකම් නිවැරදි ව අනුපිළිවෙළින් පවත්වා ගැනීමේ දී ලබන මානසික ඒකාග්‍රතාව.
  නර්තනය හා බැඳි රූපණ ක්‍රියාකාරකම්හි දී මානසික ආවේදන භාව හා හැඟීම් ප්‍රකාශනයට ඉඩ ලැබීමෙන් සිත සහනශීලී වීම.
  රස වින්දනය මානසික සුව-සහනයට හේතු වීම.
  අංග, ප්‍රත්‍යංග, උපාංග මනා පාලනයකින් ඉවසීමෙන් යුතු ව ක්‍රියා කරවීමෙන් මනෝචාලක ක්‍රියාකාරීත්වයේ වර්ධනය ඇති වීම.
  ප්‍රශංසාව හා ඇගයීම ළමයා චිත්ත ශක්තියෙන් යුතු දිරි ගැන්වීමකට හේතු වීම.
  නර්තන නිර්මාණ සඳහා සිදු කරන ක්‍රියාකාරකම් මගින් චිත්තවේගීය ගැටලු ප්‍රකාශනයට ඉඩ ලැබීම.
  සමබරතාව රැකගැනීමට නර්තන අභ්‍යාසයේ දී ලැබෙන මනා සංයමය හා ඉවසීමේ හුරුව.

**නර්තන ක්‍රියාකාරකම් තුළින් වර්ධනය වන හැකියා**

- බෙදාහදා ගැනීම
- සහයෝගය
- නීති රීති පිළිපැදීම
- නායකත්වයට ගරු කිරීම
- ජය පරාජය සමසිතින් පිළිගැනීම
- ඉවසීම
- කැපවීම
- කඩිසරබව
- තර්කානුකුල චින්තනය
- නිර්මාණශීලී චින්තනය
- ශාරීරික චලන පාලනය

**විවිධ සහාය**

| | | |
|---|---|---|
| **කංචුක නිර්මාණය** | - | රවීන්ද්‍ර තේනුවර මහතා<br>කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **පරිගණක වදන් සැපයුම** | - | ඒ.ටී.එස්. ගමගේ මහත්මිය<br>එන්.ඩබ්.ඩී.පී. කුමාරසිරි මෙනවිය<br>ඩී.සී. ජයකොඩි මහත්මිය<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **විවිධ සහාය** | - | මාලනී වික්‍රමනායක මහත්මිය<br>කේ.පී. පෙරේරා මහතා<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |